DOI: https://doi.org/10.4038/jdrra.v2i2.38

*The Journal of Desk Research Review and Analysis, Vol. 2, Issue 2, 2024, 1-23*

# THE BRITISH ARMY MASSACRE AT KANDY IN 1803?

S Herath[1]

**Abstract**

It is nominally stated in historical sources that the war waged by the British, the controller of the coastal area of Ceylon, against the Kingdom of Kandy ended with the massacre of British soldiers in 1803. Suspicions arise that the British administrators purposefully avoided including the word "massacre" in their written evidence. The War of 1803, begun by order of Governor Frederick North, led by Hay McDowell, was commanded on the ground by Adam Davie. The objectives of this research were to find out whether this war ended in a massacre on the British side if there was a massacre, what quantitative and qualitative numerical data and information could be used to confirm it, and what methods were used by the Kandyan army to the massacre. Historical research methodology has been used for this research. Encirclement; silent attack; massacring after grouping and isolation as ordinary soldiers and officers, Asian soldiers, and European soldiers; starving to death; killing by cutting the body into parts using a sword; abandoned to death in the mud while alive; beating to death only on the head of a person by using sticks and clubs until the brain comes out; were the methods of destruction used by the Kandyan army to assassinate the British army. For the war of 1803, 7 regiments from the British and a pioneer Lascarin army entered the Kandy state. The total number of troops that entered Kandy for the subjugation of Kandy was 3387. from 1st January to 30th June 1803, the number of soldiers who died on the British side was 1091. Adam Davy died while a hostage in Kandy. It is justified to include in Sri Lankan war history that the British soldiers were "massacred" in the war with the Kingdom of Kandy in 1803.

***Keywords***: War of 1803, massacre, British forces, Kandy army, killing methods

[1] Senior Lecturer, Department of History, University of Kelaniya, Sri Lanka

Email: samanh@kln.ac.lk https://orcid.org/0000-0001-8704-5727

The Journal of Desk Research Review and Analysis © 2024 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 23.08.2024
Accepted date: 22.10.2024

## 1803 දී උඩරට ආක්‍රමණය කළ බ්‍රිතාන්‍ය හමුදාව සමූලඝාතනය වීද?

එස්. හේරත්

**සාරසංක්ෂේපය**

මුහුදුබඩ පාලනය කළ බ්‍රිතන්‍යයෝ මහනුවර රාජ්‍යට එරෙහිව සිදු කළ 1803 යුද්ධය බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ "සමූල ඝාතනයකි"න් අවසන් වූ බවට නාමමාත්‍රික ඓතිහාසික සඳහනක් ලැබේ. එහෙත් "සමූල ඝාතනය" නැමැති වචන ද්විත්වය බ්‍රිතාන්‍ය පරිපාලකයෝ අරමුණු සහගතව ම තම ලිඛිත සාක්ෂිවලට ඇතුළත් නොකිරීමට වගබලා ගත් බවට සැක මතු වේ. ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකරුගේ නියෝගයෙන්, හේ මැක්ඩොවල්ගේ හමුදා නායකත්වයෙන් ඇරඹුණු 1803 යුද්ධය, යුද භූමිය තුළ මෙහෙය වූයේ ඇඩම් ඩේවිගේ නායකත්වයෙනි. මහනුවර රාජ්‍ය සමඟ සිදු වූ යුද්ධය බ්‍රිතාන්‍ය පාර්ශ්වයේ සමූල ඝාතනයකින් කෙළවර වූයේ ද, සමූල ඝාතනයක් කළේ නම් ඒ බව තහවුරු කළ හැකි ගුණාත්මක තොරතුරු සහ සංඛ්‍යා දත්තයන් කවරේ ද, මහනුවර හමුදාව විසින් එය සිදු කළේ කවර සතුරු ඝාතක ක්‍රම අනුගමනය කරමින් ද යන්න අනාවරණය කරගැනීම මෙම පර්යේෂණයේ අරමුණු විය. ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය මෙම පර්යේෂණය සඳහා භාවිත කර තිබේ. වටකර පහර දීම, නිහඬ ප්‍රහාර එල්ල කිරීම, බ්‍රිතාන්‍ය සේනාංකයන්හි සාමාන්‍ය සෙබළ සහ නිලධාරීන් වශයෙන් ද ආසියා සෙබළු සහ යුරෝපා සෙබළු වශයෙන් ද කාණ්ඩ කිරීමෙන් සහ හුදකලා කිරීමෙන් පහර දීම සහ ඝාතනය කිරීම, නිරාහාරව තබා ජීවිතක්ෂයට පත් කරලීම, කඩුවෙන් ශරීරය කොටස්වලට කපා ඝාතනය කිරීම, පණ අදිමින් සිටියදී මඩගොහොරු තුළ දමා මියැදීමට ඉඩ හැරීම, පොල්ල හා මුගුර භාවිතයෙන් හිසට පමණක් මොලය එළියට එන තෙක් පහරදී ඝාතනය කිරීම යන ඝාතක ක්‍රම බ්‍රිතාන්‍ය සේනා බලය විනාශ කිරීම පිණිස මහනුවර හමුදාව යොදා ගත්හ. 1803 යුද්ධය සඳහා බ්‍රිතාන්‍ය පාර්ශ්වයේ රෙජිමේන්තු 7ක් සහ පුරෝගාමී ලස්කිරිඤ්ඤ හමුදාවක් මහනුවර රාජ්‍යයට ඇතුළු විය. මහනුවර රාජ්‍ය යටත් කිරීම පිණිස මහනුවරට ප්‍රවිෂ්ට වූ මුළු භට සේනා සංඛ්‍යාව 3387 කි. 1803 ජනවාරි 1 වැනි දින සිට ජූනි 30 වන දින දක්වා කාලය තුළ පමණක් බ්‍රිතාන්‍ය පාර්ශ්වයේ මිය ගිය සෙබළ සංඛ්‍යාව 1091කි. ඇඩම් ඩේවි ප්‍රාණ ඇපකරුවෙකු ලෙස මහනුවර සිර අඩස්සියේ සිටියදී මරණයට පත් විය. 1803 ඇඩම් ඩේවිගේ ආඥාපතිත්වයෙන් මහනුවර රාජ්‍ය සමඟ සිදු වූ යුද්ධය නිසා බ්‍රිතාන්‍ය පාර්ශ්වයේ සෙබළු ''සමූල ඝාතනයකට" ලක් වූ බව ලංකාවේ යුද ඉතිහාසයට ඇතුළත් වීම යුක්ති යුක්ත ය.

***මුඛ්‍ය පද:*** 1803 යුද්ධය, බ්‍රිතාන්‍ය සේනාංක, මහනුවර හමුදාව, ඝාතක ක්‍රම, සමූල ඝාතනය

**හැඳින්වීම**

1800 දී ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකරු මහනුවර රාජධානිය සමඟ ගිවිසුම්ගත වීම සඳහා උත්සාහ කළේය. ඒ අරමුණින් ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකරු ජනරාල් හේ මැක්ඩොවල් තානාපතිවරයෙක් වශයෙන් ආරක්ෂක පිරිසක් ද සමඟ මහනුවරට යැවීය (Diary of Mr. John D'Oyly, 1917). මෙය 1800 මාර්තු 12 වන දින සිදු විය. මෙකල මහනුවර මහාධිකාරම්වරයා වූ පිළිමතලව්ව සහ ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලයේ සිට බ්‍රිතාන්‍යය පරිපාලකයන් අතර සම්බන්ධතා ගොඩනැගෙමින් පැවතිණි. ඒ අනුව මැක්ඩොවල්ගේ තානාපති ගමනට පිළිමතලව්වගේ පක්ෂපාතිත්වය හිමි විය. එහෙත් මෙම තානාපති ගමන අසාර්ථක විය. ඒ අනුව ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකරු මහනුවර යුධමය වශයෙන් පරාජය කිරීම අපේක්ෂා කළේය. එහි ප්‍රතිඵලය වූයේ 1803 ජනවාරි 31 මහනුවරට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීමයි. මෙම සටන සඳහා කණ්ඩායම් දෙකක් ලෙස ගමන් මාර්ග දෙකකින් බ්‍රිතාන්‍ය හමුදා මහනුවර ළඟා විය. හේ මැක්ඩොවල්ගේ හමුදා අණ දෙන නායකත්වයෙන් යුක්තව 1900 ක සේනා බලයකින් යුක්තව 1803 ජනවාරි 31 දින කොළඹින් පිටත් වූ අතර මෙම කණ්ඩායට 51වැනි රෙජිමේන්තුවේ පාබල සෙබළුන් 625 ඇතුළත් විය. අනෙක් කණ්ඩාම ත්‍රිකුණාමලයෙන් පිටත් වූයේ 1803 පෙබරවාරි 04 කර්නල් බර්ටන් ගේජ් බාර්බට්ගේ නායකත්වයෙන් යුක්තව 1434 ක හමුදා සේනාංකයකින් යුක්තව 73 වන රාජකීය බලඇණිය ද සහිතව ය (David, 1995)

1803 පෙබරවාරි 24 වැනි දින මහනුවර අල්ලා ගත් බ්‍රිතාන්‍යයෝ 1803 මාර්තු 8 වැනි දින මුත්තු සාමි රජු ලෙස කිරුළු පැළඳවීය. මහාධිකාරම් පිළිමතලව්ව, බ්‍රිතාන්‍ය පාර්ශ්වය සමඟ ඇතිවූයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට විරුද්ධව වූ රහස් සම්බන්ධතාවක් වූ නමුදු පිළිමතලව්ව රජුගේ පක්ෂයේ රැඳී සිටිමින් බ්‍රිතාන්‍යයන් සමඟ කුමන්ත්‍රණ කළේය. මාර්තු 28 වැනි දින මැක්ඩෝවල් දෙවැනි අධිකාරම් සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වූ අතර ගිවිසුමක් ද යෝජනා කළේය. ඒ අනුව මුත්තු සාමි තමන්ගේ රාජසභාව යාපනයේ තැබිය යුතු වූ අතර පිළිම තලව්වේ 'උතුම් කුමාරයන්' යන පදවි නාමයෙන් රාජධානිය පාලනය කිරීමටත්, ත්‍රිකුණාමලය තෙක් මාවතක් ලබා දීමටත්, මැක්ඩොවල් කොටුව (මාතලේ) ගොඩ නැඟීමටත්, සත් කෝරල මුළුමනින් ම බ්‍රිතාන්‍යයන්ට පැවරීමටත් නියමිතව තිබුණි.

අප්‍රේල් 1 වැනි දින ජෙනරාල්වරයා මහනුවරින් පිටත්ව ගියේ කර්නල් බාබට් යටතේ කුඩා ආරක්ෂක බළඇණියක් ද, රටේ වෙනත් තැන්වල හමුදා භටයන් කිහිප දෙනෙක් ද ස්ථානගත කිරීමෙන් අනතුරුව ය. දඹදෙණියට පැමිණීමේ බලාපොරොත්තුවෙන් පිටත් වූ ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකරු සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමට මනාප වූ පිළිම තලව්වේ මැයි 3 වැනි දින ඔහු හමු වූ අතර මාර්තු 28 වැනි දින යෝජනා කර ගත් ගිවිසුම එදින ස්ථිර විය. මෙහිදී ආණ්ඩුකරු අත්තඩංගුවට ගැනීමට අධිකාරම් සැලසුම් කළ ද මහනුවර සිට බලඇණියක් සමඟ කර්නල් බාබට්ගේ පැමිණීම මත, එම සැලසුම නිෂ්ඵල විය.

කර්නල් බාබට් මැයි 21වැනි දින කොළඹදී මිය ගිය අතර මේ අනුව මහනුවර හමුදාවේ අණදෙන නිලධාරී තනතුර ඇඩම් ඩේවිට පැවරුණි. මැයි 23 වැනි දින අධිකාරම්ගේ හදිසි ඉල්ලීම පරිදි මැක්ඩෝවල් මහනුවරට පැමිණියේය. එහෙත් අධිකාරම් හමුවීමට නොහැකි වීම මත ඔහු ජූනි 11වැනි දින කොළඹ බලා ගියේය. ගලගෙදර සහ ගිරිහාගම යන ආරක්ෂක මුරපොළවල් කන්ද උඩරටියන් විසින් අල්ලා ගැනීම මත මැයි 23 වැනි දින තාවකාලික යුධ සහනය බිඳ වැටුණි. පසු දිනයේ, මහනුවර හමුදාවෙන් බ්‍රිතාන්‍ය සේනාවන්ට ප්‍රහාර එල්ල විය. මේ ප්‍රහාරයට මුහුණදීමට බ්‍රිතාන්‍ය සේනාංකයෙන් නිරෝගී සුවයෙන් පසුවූයේ 20දෙනෙකු පමණි. පැය දහයක සටනකින් පසුව යටත්ව බ්‍රිතාන්‍ය හමුදාව පිටත්ව ගිය නමුත් මහවැලි ගගේ ගංවතුරට හසුව වටපුළුවේ කඳවුරු බැඳ සිටින බව මහනුවරින් අනාවරණය කරගන්නා ලදී. මැයි 25 වැනි දින රජු විසින් යටත් වීම හා බැඳුණු කොන්දේසි උල්ලංඝණය කරමින් මුත්තු සාමිව භාර දෙන්නේ නම් ආරක්ෂිතව පිටව යාමට අවසර දෙන බවට පොරොන්දු වූ අතර එය සිදු නොකර බේරීම සිදු කළ නොහැකි වූ හෙයින් එය එලෙසින් ම සිදු විය.

මැයි 26 වැනි දින මරණයේ වේදනාව සහිතව සිටි සියල්ලන්ට ම නිරායුධව මහනුවරට පැමිණෙන ලෙස රජු නියෝග කළේය. මෙම සේනාවේ නිලධාරීන් පමණක් අගනුවරට ගෙන යන ලද අතර, පලා යමින් සිටි කිහිප දෙනෙකු හැරෙන්නට සියල්ලෝ කෲර ලෙස ඝාතනය කෙරිණි. මහනුවර රෝහලේ සිටි රෝගීන් 149දෙනෙකු මරණයට පත් කරන ලදී. කන්ද උඩරටින්ගේ තොරතුරු දැක්වීමට අනුව, මැයි 26 වැනි දින ඩේවි සහ නිලධාරීන් දෙදෙනකුට අතුරු මඟක දී අධිකාරම්ව හමුවීමට ආරාධනා කරන ලද අතර ඊට හේතු වූයේ හමුදාව ගඟෙන් එතෙරට ගෙන යාමේ කටයුතු පිළිබඳ අවසන් එකඟතාවකට එළඹීම ය. මුල්ලේගම සහ වෙල්ලස්සේ මිල්ලව දිසාව යන දෙදෙනා ඇතුළුව ප්‍රධානීන් තිදෙනෙකු ඩේවි හමුවූ අතර රජුට ඔහු සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට අවශ්‍ය බව පැවසූයෙන් මේජර්වරයා ඊට එකඟ විය. එමඟින් ඔහු සහ ඔහුගේ සගයන් සිර ගත කරන ලදී. ඩේවිගේ පණිවිඩයක් යැයි හඟවමින්, හමුදාවේ ආයුධ බිම තබා සමූල ඝාතනය කරන ලද අතර, මුත්තු සාමි මහනුවරට ගෙන ගොස් රජුගේ නියෝග අනුව මරා දමන ලදී. දිවි ගලවා ගත් භට පිරිස් අතර මඟදී එල්ල වූ අභියෝගයන් සමඟ සටන් කරමින් වෙරළට ගොස් සහනයක් ලබා ගත් අතර ජූලි 2 වැනි දින වන විට උඩරට පළාත්වල බ්‍රිතාන්‍ය හමුදාවේ කිසිවෙකු රැඳී සිටියේ නැත.

**පර්යේෂණ ගැටලුව**

මහනුවර රාජධානිය සහ මුහුදුබඩ බ්‍රිතාන්‍ය පාලකයන් අතර 1803 ඇති වූ යුද්ධය බ්‍රිතාන්‍යයන්ට දරුණු හානිදායක ප්‍රතිඵල අත් කර දුන් යුද්ධයක් විය. එහෙත් යුදමය වශයෙන් හමුදාවේ සිදු වූ ඝාතන ප්‍රමාණය පිළිබඳ හා ලාංකික හමුදාව විසින් බ්‍රිතාන්‍ය හමුදාව ඝාතනය කළ ආකාරය පිළිබඳ ගුණාත්මක හා සංඛ්‍යාත්මකව අනාවරණයක් වී නොමැත. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ, 1803 මහනුර රාජධානිය ආක්‍රමණය කළ බ්‍රිතාන්‍යය හමුදාව සමූලඝාතනයට ලක් වූයේ ද? එසේ වී නම් ඒ කවර ප්‍රමාණයන්ගෙන් සහ කවර ආකාරයෙන් ද යන්න අනාවරණය කර ගැනීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණය සඳහා ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රථමික මූලාශ්‍රය සහ ද්විතීයික මූලාශ්‍රය භාවිත කර තිබේ. ද්විතීයික මූලාශ්‍රයන්හි ඇතුළත්ව ඇති 1803 යුද්ධය හා බැඳුණු දෙපාර්ශවයට සිදු වූ හානි පිළිබඳව තොරතුරු අනාවරණය කර ගන්නා ලදී. පසුව ප්‍රාථමික මූලාශ්‍රයන්හි දක්නට ලැබෙන දත්ත සහ තොරතුරු සමඟ ද්විතීයික මූලාශ්‍රය සමඟ සන්සන්දනය කරමින් බ්‍රිතාන්‍ය හමුදා සේනාංකයන්ට මහනුවර රාජධානිය තුළදී සිදු වූ හානිය සංඛ්‍යා ලේඛනගත දත්තයන් උපයෝගී කරගෙන විශ්ලේෂණය කර තිබේ. බ්‍රිතාන්‍යය පාර්ශ්වයේ හමුදාවන් සම්බන්ධයෙන් අනුගමනය කළ මහනුවර හමුදාවේ ඝාතන ක්‍රම ප්‍රාථමික මූලාශ්‍රය උපයෝගී කරගනිමින් හඳුනාගත් අතර එකී කරුණු ද්විතීයික මූලාශ්‍රයන්හි සාධක උපයෝගී කරගෙන අන්තර්ගත විශ්ලේෂණයකට ලක් කිරීමෙන් පසු නිගමනය එළඹ තිබේ.

**බ්‍රිතාන්‍යයන් මහනුවර නගරය අල්ලා ගැනීම සහ මහනුවර හමුදාව එය නිදහස් කරගැනීම**

කර්නල් බාබට්ගේ මිය යාමෙන් පසු 1803 මැයි 27 මහනුවර බ්‍රිතාන්‍ය සේනාංකයේ සේනාධිපතිත්වයට මේජර් ඇඩම් ඩේවි[1] පත් විය (Marshall, 1846). ඇඩම් ඩේවිගේ සේනාව වෙත මහනුවර රාජ්‍යයෙන් එල්ල වීමට සකස් වෙමින් පවතින ප්‍රහාරයක සැලසුමක් පිළිබඳව 1803 ජූනි 23 පිලිමතලව්ව ඩේවි වෙත ලිපියක් යවමින් අනාවරණය කළේය. පිලිමතලව්වගේ දැනුවත් කිරීම මත ප්‍රතිප්‍රහාර එල්ල කිරීම සඳහා ඩේවි ආරක්ෂාව දැඩි කරමින් දිශා හතරක හමුදා කණ්ඩායම් යෙදවීය. ඒ අනුව බ්‍රිතාන්‍ය සේනාංක ස්ථානගත කිරීමේදී ඔහු අවධානය යොමු කළ ප්‍රදේශ 2ක් හඳුනාගත හැකිය. එනම්,

1. රජ මාලිගය කරා යොමු වුණු ප්‍රධාන මාර්ගවල හමුදාව යෙදවීම.
2. රජ මාලිගයෙහි නැගෙනහිර පැත්තෙහි පිහිටි කන්ද ආසන්නයේ කදවුරෙහි හමුදාව තර කිරීම.

කදවුරෙහි හමුදාව තරකරමින් ජර්මානු කාලතුවක්කු හමුදාවේ සැරයන්වරයෙකු වූ ජාන් එග්බර්ටස් තියන්ගේ (Sergeant Jan Egbertus Thoen) නායකත්වයෙන් මැලේ, සිපයි භටයන් පිරිසක් ආරක්ෂාවට යෙදවිණි. මෙම ප්‍රහාරය දියත් කිරීම සඳහා මහනුවර හමුදාවේ වගකීම දැරුවේ මැලේ[2] කපිතාන් සන්ගන්ග්ලෝ[3] (Sangunglo) ය. මේ අනුව 1803 ජූනි 24 දින මෙම ප්‍රහාරය බ්‍රිතාන්‍යයන් වෙත එල්ල විය. ප්‍රහාරයට මහනුවර හමුදාවේ 10,000ක් පැමිණියහ (Marshall, 1846). මහනුවර හමුදාව මේ ප්‍රහාරය එල්ල කළේ අඳුර සහිත වූ හිමිදිරියක ය. ප්‍රහාර එල්ල කිරීමේදී මහනුවර හමුදාව කාලවේලාව පිළිබඳ අවධානය යොමු කර ඇති බව මෙයින් ගම්‍ය වේ. ප්‍රහාරය සාර්ථකභාවය වැඩි කර ගැනීම සඳහා මෙම වේලාව පිළිබඳ සැලකිලිමත් වූයේ යැයි අදහස් කළ හැකිය. මැලේ හමුදා කණ්ඩායම කදවුරේ බ්‍රිතාන්‍ය සෙබළු වෙතට සැනෙකින් පැන ඔවුහු අත්අඩංගුවට ගත්හ (Powell, 1973). බ්‍රිතාන්‍ය සේනාංක අතර 19 වැනි රාජකීය පාබළ සේනාංකය භාරව සිටියේ බ්‍රවුන් (Brown) සහ එන්සින් බෙරී (Ensign Barry) ය. බෙංගාල කාලතුවක්කු භටයෙක් සහ මැලේ භටයින් මේ ප්‍රහාරයෙන් ජීවිතක්ෂයට පත් වූ අතර ලුතිනන් බැලැක්නි (Blakeney), කැප්ටන් හම්ප්‍රීස් (Humphries), කැප්ටන් ප්ලෙන්ඩර්ලීත් (Plenderleath) දරුණු ලෙස තුවාල ලැබූහ (Marshall, 1846). මහනුවර හමුදාවන් විසින් මෙලෙස සිදු කළ කදවුරු ආක්‍රමණය බ්‍රිතාන්‍ය සේනාංක නායකයන්ට නොදැනෙන පරිද්දෙන් සිදු වීමෙන් පෙන්නුම් කරනුයේ මෙම ප්‍රහාරය නිහඬ ප්‍රහාරයක් (silent attack) ලෙස සිදු වී ඇති බවයි. නිහඬ ප්‍රහාර එල්ල කිරීමේ ක්‍රමය ලාංකික හමුදාවේ උපක්‍රමික භාවිතයක් විය. සහායක සැරයන් ග්‍රීව්ගේ ඇස්තමේන්තුවට අනුව මෙම පහර දීම සඳහා පැමිණි මහනුවර සේනාව 20,000 ක් පමණ වේ (Powell, 1973).

සටනේදී සන්ගන්ග්ලෝ බ්‍රවුන්ට කිනිස්සෙන් ඇනීමෙන් ඔහු ජීවිතක්ෂයට පත් වූ අතර එන්සින් බෙරී විසින් බයිනෙත්තුවෙන් ඇනීමත් ඩේවි විසින් කඩුවෙන් බෙල්ලට කෙටීමත් හේතුකොට ගෙන සන්ගන්ග්ලෝ ජීවිතක්ෂයට පත් විය. මේ අතර කාලතුවක්කු හමුදාවේ ආඥාපති කපිතාන් හම්ප්‍රීස්ගේ නායකත්වය මත 19 වැනි පාබල සේනාංකයේ භටයෝ කරන ලද ප්‍රහාර හේතුවෙන් මහනුවර හමුදාව පසු බැස්සහ. ඒ අනුව මහනුවර හමුදාව ඍජු ප්‍රහාර එල්ල කිරීම නවතා වක්‍ර පහර දීම් අනුගමනයෙන් බ්‍රිතාන්‍යය හමුදා සිටි භූමිය සතර දිසාවෙන් වට කර වෙඩි තබමින් අඛණ්ඩ ප්‍රහාරක් එල්ල කළහ (Powell, 1973). වටකර අඛණ්ඩ ප්‍රහාර එල්ල කිරීම මහනුවර හමුදාවේ යුද්ධ ක්‍රියාවලියේ දක්නට ලැබෙන සුවිශේෂීතාවයකි. මහනුවර මාලිගය නිදහස් කරගැනීම සඳහා වූ මේ සටනේදී මහනුවර හමුදාව යොදා ගත්තේ වටකර අඛණ්ඩ ප්‍රහාර දියත් කිරීමේ ක්‍රමයයි. ඊට ප්‍රතිචාර ලෙස බ්‍රිතාන්‍ය හමුදාව බර අවිවලින් (heavier weapons) ප්‍රහාර එල්ල කළහ. මහනුවර හමුදා ප්‍රහාරයන්ට ප්‍රතිප්‍රහාර දීමේ හැකියාව අඛණ්ඩව පවත්වාගත නොහැකි වීම මත පස්වරු 2ට මැලේ සේනාංකයේ බ්‍රිතාන්‍ය නිලධරයෝ විසින් කොන්දේසි සහිතව යටත් විය යුතු බවට බැගෑපත් ඉල්ලීමක් ඩේවිට ඉදිපත් කළේය

---

[1] මොහු ස්කොට්ලන්තයේ එඩින්බරෝහි වැසියෙකි.

[2] මැලේවරුන් ලංකාවට සංක්‍රමණය වූයේ කිනම් වකවානුවක දැයි නිශ්චිතවම නොවේ. ජාවුන් ලෙස ද ලාංකිකයෝ මැලේවරුන්ව හැඳින්වූහ. මෙකල සිටි රාජකීය හමුදාවේ මැලේ භටයන් ඇතැමෙක් ලන්දේසීන් වෙනුවෙන් ද සේවය සැපයූ පුද්ගලයෝ වූහ. මැලේවරු ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ හමුදාවට බැඳී සේවය කළා පමණක් නොව ලාංකිකයන්ට යුධ පුහුණුව ද ලබා දුන්හ. මැලේවරු මේ වන විට ද මහනුවර රජුගේ ද කුලී හමුදාවට අනුයුක්තව සේවයේ යෙදුනු, රුදුරු ම්ලේච්ඡ ගති පැවතුම් ඇති ජාතියක් වූ අතර යුරෝපීයයන් අතර ප්‍රකට මැලේ ජාතිකයෝ ඉන්දියාවේ නැගෙනහිර ප්‍රදේශයේ බහුලව වාසය කළහ. මලක්කා අර්ධද්වීපය මොවුන්ගේ මවුබිම ලෙස සැලකෙන අතර ජාවා, සුමාත්‍රා, මොලුස්කා, පිලිපීන් හා ඉන්දීය දූපත් රුසක ව්‍යාප්තව සිටින මොවුන් ලන්දේසීන් විසින් වෙළඳම, හමුදා සේවය, කර්මාන්ත හා ඉහුම්පිහුම් සඳහා මෙරටට කැඳවා ගන්නට ඇති බව පර්සිවල් අදහස් කරයි (ඡැරජසඩැකල 1803). මැලේ සෙබළුන්ගෙන් ඇතැමුන් ලන්දේසීන් විසින් මලක්කාවෙන් හෝ සුමාත්‍රාවෙන් විශ්‍රාමිකයන් වශයෙන් මෙරට වාසය කරනු පිණිස ගෙන එන ලද්දවුන්ගෙන් පැවත එන්නන් යැයි පවෙල් අදහස් කරයි ඃඡදඇකකල 1973*. මැලේ සේනාංකය යනු ලන්දේසී වෙනුවෙන් සටන් කළ ස්වාධීන බලඇණිවලින් පැමිණි භටයන්ගෙන් නිර්මාණය වූවකි. රජු සතුව ජා මිනිසුන් 50ක් හෝ 60න් සමන්විත ආරක්ෂක භට පිරිසක් වූ අතර මොවුන්ගෙන් වැඩි දෙනා පැන ගිය ලන්දේසි වහලුන්ගෙන් පැවත එන්නන් සහ ලන්දේසි ජා සේනාංකයෙන් පලා ගිය පුද්ගලයෝ වූහ ඃඊරියකකල 1846*ග මෙරට සිටි ජාවුන්ගේ ප්‍රධානියා ''සංකීලන'' නමින් ඉංග්‍රීසි භටනේ දක්වේ (ඉ. හ., 2001 ඃ කවිය 131). මොහු රජුට පක්ෂව බ්‍රිතාන්‍යය ඝාතනය පිණිස ක්‍රියා කළ අයෙකි.

[3] ශ්‍රී වික්‍රම රාජසිංහ හමුදාවේ සිටි මොහු හැඩි දැඩි සිරුරක් සහිත කඩිසර ක්‍රියාකාරිත්වයකින් යුත් කපිතාන්වරයෙකි.

(Marshall, 1846). සටන මෙහෙය වූ නිලධරයන් පිරිසක් පැමිණ ඩේවිට කළ යෝජනාව අනුව මහනුවර හමුදාවේ පහර දීම දරුණු වූවක් බවක් ගම්‍යමාන කරයි. මහනුවර හමුදාවේ අඛණ්ඩ පහරදීම් මත බ්‍රිතාන්‍ය සේනාංකයන්හි සිටි මැලේ හටයෝ, ලස්කිරිඤ්ඤ හටයෝ සහ කුලීකරුවෝ ද සිය සේනාංක අතහැර පලා ගියහ. බ්‍රිතාන්‍යයන් මුහුණ දුන් මෙම දුෂ්කර තත්ත්වය ඇඩම් ඩේවි ලියන ලද ලිපි මගින් හෙළිදරව් වේ. ''හෙන්ඩර්සන් 11වැනි දා මිය ගිය අතර බවුසෙට් අද උදේ ද මිය ගියේය. රම්ලි හා ගොන්පිල් ද රොගාතුර විය. ලස්කිරිඤ්ඤ හටයෝ සහ මැලේ හටයෝ දුසිම් ගණන් අතහැර දමා යන අතර සියලු ම නිලධාරීන් මරා දැමීම සඳහා වටිනා ත්‍යාග පිරිනමණු ලැබේ. සතුරු සේනාවෝ අපට ආසන්න වී සිටිති. අපේ ගවයන් පැහැර ගන්නා අතර උද්‍යානයේ ඇති අපේ මෝටාර් (*කුඩා කාලතුවක්කු*) ද පැහැර ගැනීමට උත්සාහ කරයි''[4] (Powell, 1973). ඩේවිගේ ලිපියක් මූලාශ්‍ර කරගනිමින් පවෙල් දක්නව මෙම උපුටනය ඔස්සේ ඉස්මතු කළ හැකි කරුණු කිහිපයකි. එනම්, 1. හෙන්ඩර්සන්, බවුසෙට්, රම්ලි, ගොන්පිල් යන්නවුන් බ්‍රිතාන්‍ය සේනාංකයන් නායකත්වය දැරුවන් වීම සහ ඔවුන් අතරින් හෙන්ඩර්සන් සහ බ්‍රවුන් මිය ගිය බව, රම්ලි සහ ගොන්පිල් අසාධ්‍යය තත්ත්වයට බවට පත් වූ බව, 2. ලස්කිරිඤ්ඤ සහ මැලේ හටයන්ගෙන් යුක්ත සේනාංක මෙම යුද්ධය සඳහා මහනුවර පැමිණ ඇති බව, 3. මහනුවර හමුදාවන්ගේ ප්‍රහාර හේතුවෙන් ලස්කිරිඤ්ඤ සහ මැලේ හටයන් බ්‍රිතාන්‍යය බලඇණි අතහැර ගිය බව, 4. බ්‍රිතාන්‍ය හමුදා බලඇණිවල සිටි නිලධාරීන් මරා දැමීම වෙනුවෙන් මහනුවර රජු වෙතින් ලාංකික හමුදා සොල්දාදුවන්ට තෑගි නියම වී තිබූ බව, 5. බ්‍රිතාන්‍යයන්ගේ බඩු ප්‍රවාහණය සඳහා යොදා ගත් ගවයන් පැහැර ගත් බව හා කුඩා තුවක්කු පැහැර ගැනීමට උත්සාහ කළ බව යන කරුණු ය. සංඛ්‍යාත්මකව සතුරන් මරණයට පත් කිරීම වර්ධනය කරලීම සඳහා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් අභිප්‍රේරණ ක්‍රමවේදයක් අනුගමනය කළ බව පවෙල්ගේ සටහනේ විශ්ලේෂිත සිවුවන කරුණින් පෙන්නුම් කරයි. මෙම හඳුනාගැනීම ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සතු වූ මහනුවර හමුදාව සංවිධානය කිරීමේ හැකියාව ඉස්මතු කරයි. සටන් නායකයන් යුද්ධයක් මෙහෙය වීමේදී බලපොරොත්තු වන ප්‍රමුඛ කරුණ වන්නේ වැඩි වශයෙන් සතුරු ඝාතනයන් කිරීම ය (Goodman, 2013). මහනුවර හමුදාව විසින් බ්‍රිතාන්‍ය සේනාංකයන්හි සිටි හමුදා නායකයන් මහනුවර සේනාවේ ප්‍රධාන ඉලක්කය වී ඇති බව ද ඩේවිගේ ඉහත ප්‍රකාශනයෙන් අනාවරණය වේ. ඩේවිගේ මෙම ලිපිය ඔහු එම දින ලියන ලද දහවන ලිපිය බව ඔහු විසින් ම ලිපියේ පෙන්වා දෙයි. දිනකට ලිපි දහයක් ලිවීමට සිදු වීම ඩේවි ඇතුළු බ්‍රිතාන්‍ය හමුදාවේ අසරණභාවයත් ඔවුන් ලද පරාජයේ බරපතල බව සහ මානසිකත්වයේ බිඳවැටීමත් පෙන්නුම් කරයි. ඇඩම් ඩේවි ප්‍රමුඛ බ්‍රිතාන්‍ය සේනාවේ මෙම බිඳවැටීම 51 වැනි රෙජිමේන්තුවේ ලුතිනන් තෝමස් ඔර්ම්ස්බියන්ගේ ප්‍රකාශයකින් තවදුරටත් තහවුරු වේ. 'අපෙන් සමුගත් මිතුරන් ගැන මගෙන් ඔබට දිය හැකි නාමාවලිය කුමක්ද? අපට එම ස්ථානයෙන් ඉවත් වීමට අණ කළහොත් අපට කුමක් වේ දැයි දන්නේ දෙවියන් වහන්සේ පමණි, සැතපුමක් පයින් යා හැකි එකම යුරෝපීයයෙකු ද හිඟ ය. මන්ද අපට පහර දීමක් සිදුවුවහොත් අපට රාජකාරියට සුදුසු වන්නේ කාලතුවක්කු හටයන් තිදෙනෙකු පමණි' (Powell, 1973). ඝාතනයට ලක් වූ බ්‍රිතාන්‍ය සොල්දාදුවන් කවුරුන්ද යන්න පිළිබඳ තොරතුරු ලබා දීමට පවා ඇඩම් ඩේවි අපොහොසත් බවත්, තමන්ට අත්වන්නේ කවර ඉරණමක් බව දන්නේ දෙවියන් වහන්සේ පමණක් බවත්, මහනුවර රාජධානිය පැමිණි සේනාවේ සැතපුම්ක් හෝ පයින් ගමන් කළ හැකි යුරෝපීයයෙකු සොයා ගැනීම දුර්ලභ බවත්, කිසියම් පහරදීමක් සිදු වුවහොත් ප්‍රතිපහාර ලබා දීමට සඳහා සුදුසු සටන් සූදානමකින් සිටිනුයේ කාලතුවක්කු හටයන් තිදෙනෙක් පමණක් බවත් මෙම ප්‍රකාශයේ අන්තර්ගතය තුළ දැකිය හැකිය. එනම්, බ්‍රිතාන්‍ය සේනාවේ හට පිරිස සැබවින්ම විනාශ වූ බව ය.

මැලේ සේනාංකයේ ප්‍රධාන නිලධාරීන් ඩේවි වෙත පැමිණ මහනුවර හමුදාවට යටත් විය යුතු බව පෙන්වා දීමෙන් පැහැදිලි වන්නේ මේ වන විට බ්‍රිතාන්‍යයන්ගේ හමුදා පිරිස් මහනුවර හමුදාවට එරෙහිව සටනේ යෙදවීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබූ බවයි. මෙම යෝජනාවට ඩේවිගේ අකැමැත්ත ප්‍රකාශ වීම මත බ්‍රිතාන්‍ය නිලධරයෝ ඩේවිට විරෝධතාවය දැක්වූහ. ග්‍රීවිං (Greeving) හා බ්‍රිතාන්‍යය මැලේ සේනාංකයේ නිලධර නෞරදීන්[5] (Nouradeen) උඩරැටියන්ට යටත් වීම දිවි නසා ගැනීමේ තවත් ක්‍රමයක් ම වන බව පෙන්වා දුන්හ (Powel, 1973). මේ වන විට යුද තාක්ෂණික දැනුම සහිත බ්‍රිතාන්‍ය සේනාංක සතුව 19 වැනි රාජකීය පාබළ සේනාංකයේ නිලධරයෝ 2ක්, 51 වැනි රාජකීය බලඇණියේ නිලධරයෝ 2ක්, ග්‍රිවිං, නෞරදීන් ඇතුළු තවත් නිලධාරීන් හා අණ දෙන නිලධාරී මේජර් ඇඩම් ඩේවි ඇතුළු තවත් බ්‍රිතාන්‍ය සේනාවේ හටයෝ 250 ක් බර අවි සහිතව මාලිගාවේ ආරක්ෂාව ලබාගනිමින් සිටියහ. එහෙත් බ්‍රිතාන්‍යයන්ගේ හමුදා සේනාංක සංග්‍රාමීය වශයෙන් අනතුරේ හෙළීමට මහනුවර හමුදාවේ සංවිධාන ශක්තිය, සැලසුම් සහගත බව හා අඛණ්ඩ පහර දීමේ ක්‍රමය හේතු විය. මේ සටන පැය 10ක් පැවතුණි (Marshall, 1846 ; Diary of Mr. John D'Oyly, 1917). මේ සටන

[4] *"Henderson died on the 11th, and Bausset this morning: Rumley and Gonpil are also ill. ...The Lascars and Malays desert by the dozens, and high rewards are offered to murder all the officers. Batteries close upon us. Our bullocks are carried off by force and attempts even made to carry of the small mortars from the park."*

[5] නෞරදීන් යනු රජුගේ මැලේ හමුදාවේ නායකයා වූ සන්ගන්ග්ලෝගේ අඩසොහොයුරා වූ අතර නෞරදීන්ගේ ඥාතීන් විසින් බ්‍රිතාන්‍ය හමුදා සේවයෙන් ඉවත් වන ලෙස ඔහුගෙන් ඉල්ලීමක් කළ ද ඔහු එය ප්‍රතික්ෂේප කළේය.

පැවතියේ පැය හතක් පමණ බව ජෝන් ඩේවි (Davy, 1821) පෙන්වා දුන්න ද එම මතයට මූලාශ්‍රමය සාධක විරල ය.

1803 ජූනි 24 දා යුද්ධය අඛණ්ඩව පවත්වාගෙන යාමට අපොසත් වීම මත ඩේවි යටත් වීමේ තීරණයෙන් සුදු කොඩි ඔසවා සන්සුන්ව කොළඹට ළඟා වීමට අවසර ලබා ගත්තේය[6] (Diary of Mr. John D'Oyly, 1917). දෙපාර්ශවයෙන් සටන් විරාම සාකච්ඡාවට සහභාගි වූයේ අධිකාරම් හා ඩේවි ය. ඔවුන් අතර ඇති වූ එකඟතා වූයේ බ්‍රිතාන්‍යයන් ඉතා ඉක්මණින් මහනුවර භාර දිය යුතු බව, තම ආයුධ සමඟ මහනුවරින් පිටව යා යුතු බව, මුත්තු සාමි රැගෙන යාමට අවසර දිය යුතු බව හා අසනීපවූවන් හා තුවාල ලැබූවන් ඩේවි ඇතුළු පිරිස කොළඹට හෝ ත්‍රිකුණාමලයට යන තෙක් රැකබලා ගත යුතු බවත්[7] (Marshall, 1846). ආරක්ෂා සහිතව ත්‍රිකුණාමලයට යාමට ඉඩ දීමේ පොරොන්දුව[8] සහ අධිකාරම් විසින් රෝගීන්ගේ රැකවරණය සැලසීම යන කොන්දේසි මත යටත් වූ බව මේ සම්බන්ධයෙන් අදහස් දක්වන කොඩ්රින්ටන් සඳහන් කරයි (Diary of Mr. John D'Oyly, 1917). එහෙත් ජෝන් ඩේවි පෙන්වා දෙන්නේ මේජර් ඩේවිට තම රෝගීන් පවා අතහැර මහනුවර නගරය හැර යන ලෙස ලද නියෝගය අනුව කොන්දේසිවලට එකඟව ගමන් කළ හැකි මට්ටමේ සිටි සියලු බ්‍රිතාන්‍ය සොල්දාදුවන් සමඟ මහනුවරින් පිටත් වූ බවයි (Davy, 1821). ඩේවි යුද නායකයා වුව ද බ්‍රිතාන්‍ය හමුදා සොල්දාදුවන් අතර අභ්‍යන්තරිකව ඇති වූ නොසන්සුන් බව ඩේවිට යටත් වීමේ තීරණයට එළඹීමට ප්‍රබල හේතුවක් වන්නට ඇත.

1803දී බ්‍රිතාන්‍යයයෝ උඩරට ආක්‍රමණය පිණිස යොදා ගත් ගලගෙදර දුර්ග මාර්ගය හා ඇත්ගාල දුර්ගය රැකවල් ලා සිටීම මහනුවර සේනාවේ සැලසුම විය. මෙම පහර දීම නෝර්ත්ගෙන් ඩේවිට නියෝගය ලැබීමට ප්‍රථම සිදු විය. දුර්ග මාර්ග පාලනය කෙරෙන උස් තැන්වල රැදී සිට ගල්වලට හා ගස්වලට මුවා වී වෙඩි තැබීම මහනුවර හමුදාවේ විධි ක්‍රමයකි (අභයවර්ධන, 2004). මහනුවර හමුදාව මේ ක්‍රම භාවිතයෙන් ගිරිහාගල්ගම හා ගලගෙදර කඳවුරු අල්ලා ගත්හ. අල්ලා ගන්නා විට එම බලකොටු හැවිල්ඩාර් (havildar) ප්‍රමුඛ මැලේ සෙබළුගේ යටතේ පැවතිණි. මෙම ජයග්‍රහණයෙන් පසු බ්‍රිතාන්‍ය බලඇණියේ පැවති දුර්වලතා පිළිබඳ තක්සේරුවකට පැමිණි මහනුවර හමුදාව නගරය වට කර බ්‍රිතාන්‍යය සේනා සමූල ඝාතනයට සැලසුම් සකස් කළහ. 10,000ත් 50,000ත් අතර පිරිසක් යුද්ධය සඳහා මහනුවර සේනාවට ඇතුළත් විය (Powell, 1973). ඇති වූ යුද පරාජය මත දරුණු ව්‍යසනයකින් බ්‍රිතාන්‍ය සේනා මුදවා ගැනීමේ අරමුණින් 1803 ජූලි 20 වන දින මහනුවරින් ඉවත් වන ලෙස නෝර්ත් ආණ්ඩුකරු ඩේවිට දැනුම් දුන්නේය (Powell, 1973).

**මහනුවර මාළිගය අභ්‍යන්තරයේ ඝාතනයන් සහ ඝාතක ක්‍රම**

මහනුවර හමුදාව මාළිගය බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස් කරගන්නා විට එහි 19වැනි පාබළ සේනාංකයේ සෙබළුන් 120ක් වාට්ටුගත[9] කර සිටියහ (Diary of Mr. John D'Oyly, 1917; Davy, 1821). ඇතැම් මූලාශ්‍රයවල මෙම සංඛ්‍යාව 149ක් බව දැක්වේ (Lewis, 1923) මහනුවර මාළිගය තුළ එල්ල කළ මෙම ප්‍රහාරයෙන් දිවි බේරා ගත හැකි වූයේ සාජන් (සැරයන්) තියන්ට (Theon) පමණි. මෙම සෙබළුන් ඝාතනය සියැසින් දුටු තියන් කළ සඳහනක් ඇජැක්ස් ඇන්ඩර්සන්ගේ වාර්තාකරණයට අනුව පවෙල් උපුටා දක්වයි. "මාළිගය තුළ සිටි සෙබළු එහි ප්‍රධාන දොරටුවෙන් ඉතා අසීරුවෙන් පිටවූවා පමණි. කඩු, පොලු, පිහියා සහ කෙටි තුවක්කු යනාදියෙන් සන්නද්ධ වූ උඩරැටියෝ දහස් ගණනක් හැම පැත්තෙන් ම මාළිගයට කඩා වැදුණහ. ඇතැමෙක් එහි පැවති වාට්ටුවට පැන ගත්හ. තවත් යුරෝපීයයෝ 149ක් සමඟ මම ද වැතිරී සිටියෙමි. සතුරු පිරිස කඩාවැදුණු මොහොතේ මම කච්චියක වාඩි වී සිටියෙමි. මේ වන විට වාඩිවෙන්නට හැකිව සිටි එකම තැනැත්තා මා පමණි. එහෙයින් එහි වූ බිහිසුණු සිද්ධිය මම හොඳින් දැක්කෙමි. මාළිගයට ඇතුළු වූ විගස උඩරැටියෝ රෝගීන් සතු ව පැවති දෑ පැහැර ගන්නා ගමන් ම ඔවුන්ට සාප කරමින්, පරිභව කරමින්, ඔවුන්ගේ මුහුණුවලට කෙළ ගසමින් සිතුණු පරිද්දෙන් ඔවුන් කපා කොටා දමන්නට ආරම්භ කළහ. සෙබළුන්ගේ මොළ කැබලි පිටතට වීසි වන තෙක් ඔවුන්ගේ ඔලුවලට පොලු මුගුරුවලින් පහර දුන්හ. මිය ගිය අය පමණක් නොව පණ අදිමින් සිටියවුන් ද දෙපයින් ඇදගෙන ගොස් ළිඳකට දැමූහ. ඇතැම් සෙබළ සිරුරු වීදිවල විසුරුවා දැමීම නිසා බල්ලන්ට ඒවා

---

[6] ඩේවි සුදු රෙදි කඩක් (rag of white cloth) රැගෙන කපිතාන් නොරදින් ද සමඟ මධ්‍යහ්න කාලය වනවිට කන්ද උඩරට නායකයන් මුණ ගැසුණි.

[7] මෙම කොන්දේසි පුස්කොළයක ලියා අධිකාරම් හා ඩේවි අත්සන් තබා ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ නම යොදා ත්‍රිකුණාමලයට යන තෙක් යුද්ධයෙන් දිවි බේරාගත් ඩේවි ඇතුළු පිරිසට හානියකින් තොරව ගමන් කිරීම සඳහා ගමන් බලපත්‍රයක් ලෙස ලබා දී තිබේ.

[8] මෙම යටත් වීමේ කොන්දේසි ජූනි 25 වන දින රජු විසින් ප්‍රතික්ෂේප කළේය.

[9] මහනුවර මාළිගයේ ඇතැම් කොටස් යුරෝපීයයන්ගේ රෝහල් පරිශ්‍ර වශයෙන් භාවිත කළ බව පෙනේ. පෙරදී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් දාන ශාලාවක් වශයෙන් වෙන්ව තිබුණු එතරම් පළල් නොවූ දිගටි කුටියක් යුරෝපීයන් 1803 වන විට රෝහල් වාට්ටුවක් බවට පරිවර්තනය කරගෙන තිබේ. 1815 මාර්තු 17 වන විට බ්‍රිතාන්‍යයන් විසින් තමන්ගේ රෝහලක් බිසෝ මාළිගයේ ස්ථාපනය කර තිබුණි. එහි පාලනයට 3වැනි ලංකා රෙජිමේන්තුවේ මොෆට් පත් කර ඇත (Letters on Ceylon, 1817).

ආහාර විය. එකදු සිරුරක්වත් මිහිදන් නොකෙරුණි. ඇතැම් රෝගීන් සිය ඇඳන්වලින් බිමට ඇදී වාට්ටුවෙන් පිටතට බඩගාගෙන යන්නට උත්සාහ ගත් නමුත් උඩරැටියෝ ඔවුන් රෝහලෙන් පිටවන්නට කලින් මරා දැමූහ'' (Powell, 1973). මෙම ප්‍රකාශයෙන් ඉස්මතු වන කරුණු ගණනාවකි. එනම්,

1. 1803 දී මහනුවර යුද්ධ හමුදාව බ්‍රිතාන්‍ය සේනා ඝාතනය සඳහා කඩුව, පොල්ල, පිහිය හා කෙටි තුවක්කුව[10] යන අවි භාවිත කළ බව (ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අණ ලද මහනුවර හමුදාව මෙම අවි භාවිත කළ බවට සාධක බහුලව ලැබේ)[11].

2. මහනුවර මාලිගය නිදහස් කරගැනීම සඳහා දහස් ගණනක සේනාවක් මාලිගය වටකර ඊට කඩා වැදුණු බව.

3. බ්‍රිතාන්‍ය සේනාංකයන් අතර සිටි 150ක සෙබළ සංඛ්‍යාවක් මේ වන විට මාලිගය අභ්‍යන්තරයේ සිටි බව.

4. සතුරන් ඝාතනය කිරීමට පෙර සාප කිරීම, බැණ වැදීම හා මූණට කෙළ ගැසීම කළ බව (ඝාතනයට පෙර සතුරන්ගේ මානසිකත්වය හීනධීන තත්ත්වයකට හෙළීමට මෙය හේතු වේ).
5. සතුරා කපා කොටා ඝාතනය කිරීම (කඩු රැගෙන මහනුවර සේනාව පැමිණි බව මෙමඟින් තහවුරු කරයි. තුවක්කු භාවිතයෙන් වෙඩි තැබීමට වඩා කපා කොටා මරණයට ලක් කිරීම දැඩි වේදනාකාරී මරණයකට හේතු වේ).

6. පොල්ල හා මුගුර හිසට පහරදීම සඳහා භාවිත කළ බව (වාගොල්ලේ පිටියේදී වද දී ඝාතනය කරන අවස්ථාවේ බ්‍රිතාන්‍ය සේනාවන්ගේ කන් නාසා කපා, පඳුරක් ගානේ බිම දිගේ ඇදගෙන යමින් ශරීර අස්ථි, ඇට කුඩු කර ඝාතනය කළේ පොල්ල සහ මුගුරෙන් පහර දීමෙනි)[12]

7. ඝාතන ක්‍රමයක් ලෙස හිසට පහර දීම කළ බව (මොලය එළියට එන තෙක් සතුරාගේ හිසට පහර දීම දරුණු වේදනාකාරී මරණයකට හේතුවකි. අයෙකුට එවැනි පහරදීම් සිදු වන විට එය බලා සිටින සෙස්සන් ඉන් කම්පනයට පත් වේ. මහනුවර හමුදාව මෙම පහරදීම් මඟින් බ්‍රිතාන්‍ය සේනාංකයන්හි සිටින සෙබළු මානසික පීඩයකට ලක් කිරීමටත්, ඒ වේදනාත්මක අත්දැකීමක් සහිතව මරණයේ අත්දැකීම විඳ ගැනීමටත් ඉඩ ප්‍රස්ථාව සකස් කර තිබේ)

8. සතුරු මළසිරුර මාර්ගවල විසුරුවා දැමීම හා කිසිදු සිරුරක් මිහිදන් නොකිරීම (සතුරාගේ මළ සිරුරු කෙරෙහි පවා දැක්වූ අගෞරවය මෙමඟින් ගම්‍ය කරයි. මළ සිරුරු බල්ලන්ගේ ආහාරය පිණිස ගැනීමට දැමීම ජාතියක් ලෙස බ්‍රිතාන්‍ය ආක්‍රමණික සේනා ලබා ගැනීමට උත්සාහ කළ ගෞරවාන්විත උසස් බව දැඩි හෑල්ලුවට ලක් කිරීමකි).

9. මිය ගිය සතුරු සිරුර සමඟ පණ අදිමින් සිටි සතුරන් එකම ලිදකට දැමූ බව (මළමිනී සමඟ පණ ඇති මිනිසුන් එකම වලකට දැමීම මහනුවර යුද්ධ සේනාවේ තවත් දරුණු පුද්ගල ඝාතන ක්‍රමයක් පෙන්නුම් කරනු ලබන්නකි)

19වැනි පාබල සේනාංකයේ නායක සහ ඒ වන විට රෝහලේ ඉතිරිව සිටි එක ම නිලධරියා වූ ලුතිනන් පීටර් ප්ලෙන්ඩර්ලීත් (Peter Plenderleath) ද අලුයම එල්ල කරන ලද මෙම ප්‍රහාරයෙන් බරපතල තුවාල ලැබූ අතර තවදුරටත් ඔහුට පහරදී මරණයට පත් වනු පිණිස සටන්කරුවෝ ඔහුව අගලකට (gutter) ඇද දැමූහ. අගල යනු ස්වභාවයෙන්ම මඩ, කුණු සහිත වූවකි. සතුරන් ඝාතනය පිණිස මහනුවර හමුදාව ප්‍රාණය නිරුද්ධ වන තෙක්

---

[10] ''සතුරන්ට නොව ඉඩ - සිය සෙන් හරින වෙඩි හඩ
යුගත සිඳු ගොස මැඩ - ඇසෙයි ගනගුම් විලස නොව කඩ'' (ඉංග්‍රීසි හටන, 2001 ඃ 126)

[11] ''තවද මෙහිමි වදහළ පණිවිඩ පණතින් ගොසින් අයෙක්
කඩුද කොන්ත දුනු තුවක්කු යවුල් මුගුරු දරා නොයෙක්
පැහැද නුවර මාද වදිමින් කෙළින රඟට සැන කෙළියක්
නොමද රුපුන් ඇන ඇන සිඳ බිඳ දමමින් මැරී එතෙක්'' (ඉංග්‍රීසි හටන, 2001 ඃ 155)

[12] ''අයෙක් මෙ සිංහල බලසෙන් එඩි වැඩී බල තඩි ගත්තෝ
නොයෙක් රුපුන් සිඳ බිඳ ඔළුගෙඩි පොඩි කර ජය ගත්තෝ'' (ඉංග්‍රීසි හටන, 2001 ඃ 157)
''උලා දනින් හම යන තුරු ඇද ඇද පඳුරක් පාසා
විලාප කියමින් හඬවා උන්ගෙ ඉංග්‍රිසි බාසා
රිලා මොටුන් ලෙස පෙරළා ගෙන කපමින් කන් නාසා
තළා මුගුරු ගෙන ඇට බිඳ හරිමින් යුදයෙහි ආසා'' (ඉංග්‍රීසි හටන, 2001 ඃ 164)
''සද්දෙන් ගිගුම් වෙඩිලි මැද්දෙන් ගොසින් පතින යුද්දෙන් නරන් පොලු ගසා'' (ඉංග්‍රීසි හටන, 2001 ඃ කවිය 245)
''කඩු ද කොන්ත ද දුනු තුවක්කු යවුල් මුගුරු දරා නොයෙක්'' (ඉංග්‍රීසි හටන, 2001 ඃ කවිය 155)

තබා නොසිට මෙවැනි පාරිසරික ස්ථානයන්හි මිය යාමට අතහැර ගිය බවට සාධක ලැබේ. කාලගුණික සාධක මත ස්වභාවිකව ම නිර්මාණය වූ මඩ වගුරු කන්ද උඩරට පැවතිණි. 1803 දී මහනුවර නගරයේ දකුණු පැත්ත විශාල මඩ වගුරකින්[13] සීමා වී පැවති අතර ඉන් නිකුත් වූ දුර්ගන්ධය මිශ්‍ර වාතය නිසා බ්‍රිතාන්‍ය සෙබළු බහුල වශයෙන් රෝගාබාධයන්ට ද ලක් වූහ. මාතලේ ප්‍රදේශයේ ද පහත් බිම්වල මෙවැනි මඩ වගුරු පැවති අතර මේවායින් වහනය වන දුර්ගන්දයෙන් බ්‍රිතාන්‍ය සේනාවන්ට පමණක් නොව ස්වදේශිකයන්ට ද බලපෑම් එල්ල විය (Letters on Ceylon, 1817). මාලිගයේ ගිනිකොන දිග කෙළවරෙහි ද ආසියා සෙබළු සඳහා වෙන් වූ රෝහලක් පැවති අතර එහි ප්‍රතිකාර සඳහා නැවතී සිටි මැලේ භටයන් 23ක් හා මරක්කල තුවක්කුකරුවන් 17ක් ද මහනුවර හමුදාව කඩුවෙන් කපා ඝාතනය කළහ. තියන්, මුත්තු සාමිගේ සේවකයන් සමඟ සිර ගත කෙරිණි (Powell, 1973). 1815 දී ගාල්ලේ බ්‍රිතාන්‍ය කඳවුරට ගෙන එන තුරු වසර 12ක කාලයක් රජුගේ සිර අඩස්සියේ සිටීමට තියන්ට සිදු විය (David, 1995). සාප කිරීම, බැණ වැදීම, මූණට කෙළ ගැසීම, මොලට පිටතට එන තෙක් හිසට පහර දීම, කපා කොට ඝාතනය කිරීම යන සිදුවීම් සංග්‍රාම සංකල්පයේ ලාංකිකයන්ගේ දරුණු බවත්, සතුරු පාර්ශ්වයන් කෙරෙහි ලාංකිකයන් දැක්වූ ආකල්පයත් විද්‍යමාන කරයි.

19වැනි රෙජිමේන්තුවට අයත් වූ මේජර් බිවර් සඳහන් කරන්නේ මේ මිය ගිය ගණන 149ක් බවත්, 1815 දී බ්‍රිතාන්‍යයන් මහනුවර බලය අල්ලා ගැනීමෙන් පසු බේරුම් කිරීමේ නිල ප්‍රකාශය නිකුත් කරන අවස්ථාවේ රොබට් බ්‍රවුන්රිග් ප්‍රකාශ කළේ 1803 දී මෙසේ රෝහල්ගත වී සිට ඝාතනය වූ සංඛ්‍යාව 150ක් බවයි (Marshall, 1846). ඇජැක්ස් ඇන්ඩර්සන්ගේ වාර්තාව පවෙල් විසින් උපුටා දැක්වීමත්, 149කගේ ඝාතනය මහනුවර යුද්ධ හමුදාවේ ඉතා දරුණු පහරදීමක් බව වැඩබලන නියෝජ්‍ය අණදෙන සහායක ජනරාල් වූ කපිතාන් එල්. ඩී. බුෂේ (Letters on Ceylon, 1817) විසින් පෙන්වාදීමත්, මෙම සටන පිළිබඳ ප්‍රධාන ම දේශීය ප්‍රාථමික මූලාශ්‍රය වන ඉංග්‍රීසි හටනේ සටනේ ඝාතනයන් සම්බන්ධ විස්තරයක් ඉදිරිපත් වීමත් අනුව මහනුවර සේනාවේ මෙම ඓතිහාසික සතුරු ඝාතනය අතිෂෝක්තියක් නොවන බවට මූලාශ්‍රමය සාධක තහවුරු කරයි.

**මුත්තු සාමි ඇතුළු පිරිස ඝාතනය සහ ඝාතක ක්‍රම**

මහනුවර රජු බවට සිංහාසනාරූඪ කළ මුත්තු සාමි ඝාතනය වන්නේ ඩේවි ප්‍රමුඛ බ්‍රිතාන්‍ය සේනාංකයන්හි ආරක්ෂාව යටතේ සිටියදී ය. 1803 ජූනි 24 වැනි දින යුරෝපීය නිලධරයෝ 14ක්, බ්‍රිතාන්‍ය සොල්දාදුවෝ 20ක්, මැලේවරු 250ක්,  ලස්කිරිඤ්ඤ තුවක්කු භටයන් 140ක්, මුත්තු සාමි සහ ඔහුගේ ආවතේවකරුවන්, යන පිරිස් මහනුවර නගරයෙන් පිටව ගියහ (Marshall, 1846; Philalethes & Knox, 1817). මෙම සේනාවට පිටවී යාමට නොදී ලුහුබැඳ ගොස් ඔවුන් මරා දමන ලෙස රජු විසින් මහඅදිකාරම් පිලිමතලව්වට හා මලවට නියෝග කළේය (Davy, 1821). පරාජිත සතුරා ලුහු බැඳ ගොස් පහරදීමට අරමුණු කිරීමෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට බ්‍රිතාන්‍යයන් විනාශ කිරීම සම්බන්ධයෙන් පැවති දැඩි ආශක්තතාව, අභීත භාවය හා අපරාජිත භාවයේ අපේක්ෂාව ඉස්මතු කරවයි. මේ අනුව මාලිගය ආරක්ෂා කර ගැනීමට කළ සටනට පසු දින ඇඩම් ඩේවි ඇතුළු සේනාව මහවැලි ගඟ තරණය කිරීමට නොහැකිව සිටියදී උඩරට හමුදාව ජලදුර්ග උපයෝගී කර ගනිමින් ඔවුන් කොටු කර ඝාතනය කරලීමට සැලසුම් සකස් කළහ. ඩේවි පසුබැසීමේදී මුත්තු සාමි ඇතුළු පිරිස සමඟ රාත්‍රි කාලයේ මහවැලි ගං ඉවුරේ මාවිල්මඩ (Mawilmada) ගම්මානය අසළ වටපුලුව[14] (Watapuluwa) (Diary of Mr. John D'Oyly, 1917; Powell, 1973) තොටුපොළට පැමිණ ගං වතුර හේතුවෙන් යා නොහැකිව සිටිය දී පිලිමතලව්ව හා මලව විසින් එම පිරිස මහනුවර අසළ උඩුවෙල නැවතී සිටි රජු ඉදිරියට පමුණුවණු ලැබීය (ඉ. හ., 2001 ː කවිය 171; Davy, 1821). ජූනි 26 වන දින පෙරවරු 11 පමණ අවිආයුධ ගත් මැලේ හමුදාව 100ක්, කාපිරි[15] සෙබළු 80ක්, තවත් ස්වදේශික හමුදාව අති විශාල ප්‍රමාණයක් පැමිණ සියලු ආරක්ෂක බලකොටු ආයුධ රහිතව නැවත මහනුවර රාජ්‍යයට භාර දිය යුතු බවත් එසේ නොකරන්නේ නම් ඝාතනය කරන බවටත් සඳහන් රජුගේ නියෝගයක් නිකුත් කළ බව මේ සම්බන්ධයෙන් මාෂල් කරුණු දක්වයි (Marshall, 1846). ඒ අනුව 5000කින් යුක්ත සේනාවක් මෙලෙස බ්‍රිතාන්‍යයන් වෙත පැමිණ ඔවුන් වට කළ බවත්,  (Powell, 1973). රජුගේ නියෝජිතයන් ලෙස මහනුවර හමුදාවේ ජෝසෆ ප්‍රනාන්දුගේ (Joseph Fernado) නායකත්වයෙන් යුතු මැලේ හා කාපිරි (කවිසි, නීග්‍රෝ (ඉ. හ., 2001 ː කවිය 33) භටයන් 200ක් පමණ පිරිසක් ඩේවි වෙත පැමිණ ඔවුන්ගේ

---

[13]පසු කලෙක ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මිනිසුන් බලහත්කාරයෙන් සේවයෙහි යොදවමින් මෙම මඩ වගුර විශාල ජලතලා දෙකක් බවට පත් කළේය.

[14] යුද්ධය වූ දින රාත්‍රියේ මොවුන් නුවරින් පිටවී ගොස් වාකොළ (Wakola) නැවතුණු බව ඩොයිලි සඳහන් කරයි (Diary of Mr. John D'Oyly, 1917). මේ නම් දෙකෙන්ම අදහස් කරන්නේ එකම ස්ථානයක් විය යුතුය. මාෂල් මෙය Watapologa යනුවෙන් සඳහන් කරයි (Marshall, 1846)

[15]කාපිරි ඉතා දරුණු ම්ලේච්ඡ ජාතියක් ලෙස සලකනු ලබන අතර අප්‍රිකානු ජන්මයක් සහිත පිරිසකි. එහෙයින් ඔවුන්ට යුද්ධයකදී පැවති යුතු දරාගැනීමේ ශක්තිය ප්‍රබල විය. කාපිරි මිනිසුන්ගේ ශරීර ප්‍රකෘතිය මේ දිවයිනේ සෑම දේශගුණයකට ම ඉතා යෝග්‍ය වූ බව පෙනේ (Vimalananda, 1970). ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ සේනාව සතුව කාපිරි හා ජා (මැලේ) සේනා සිටියහ (දුනුවිල හටන 1957).

අවි ආයුධ භාරදී මහනුවරට පැමිණෙන ලෙස දන්වා සිටිය බවත් ඩේවි බ්‍රිතාන්‍ය හටයන්ගේ අවි බිම තබන ලෙස නියෝග කළ ද ඊට විරෝධයක් මතු වූ බවත් මේ සම්බන්ධයෙන් ෆිලලෙත්ස්, නොක්ස් සහ පවෙල් පෙන්වා දෙති (Philalethes & Knox, 1817 ; Powell, 1973). ගඟෙන් එතෙර වීම සඳහා හම්ප්‍රි විසින් එගොඩ ඉවුරේ ගැට ගසන ලද කඹය මහනුවර වැසියන් කිහිප දෙනෙකු විසින් කපා ලීමේ සෘජු ප්‍රතිඵලය වශයෙන් බිය වූ මැලේ හා ලස්කිරිඤ්ඤ හටයෝ කණ්ඩායම් වශයෙන් යුරෝපීය හමුදාව හැර ගිය අතර සටන් අවස්ථාවන්හිදී මහනුවර හමුදාව මෙවන් උපක්‍රම අනුගමනය කරනු ලැබුවේ බ්‍රිතාන්‍ය සේනා අනතුරේ හෙළීමට පමණක් නොව බ්‍රිතාන්‍ය සේනාවන්ට උදව් දුන් සෙබළු බිය ගන්වා පලවා හැරීමේ අදහසින් බව පෙනේ (Marshall, 1846). එම උපක්‍රමය සාර්ථක වූවා පමණක් නොව බ්‍රිතාන්‍ය ඇඳුමින් සැරසී පැන යන මේ පිරිස් විසින් ම බ්‍රිතාන්‍යයන්ට වෙඩි තැබීම ද සිදු විය. මෙහිදී මුත්තු සාමි පවා දෙන ලෙසත්, ඒ සඳහා ප්‍රතිඋපකාර ලෙස ගඟෙන් එතෙර වීමට බෝට්ටු ලබා දී ත්‍රිකුණාමලයට යන තෙක් යාමට අවසර දෙන බවත් මහනුවර ප්‍රධානීන් සිවු දෙනෙකු මාර්ගයෙන් රජු දැනුම් දුන්නේය. මෙය ඩේවි විසින් ප්‍රතික්ෂේප කළ ද රජු නැවත ප්‍රහාර එල්ල කරන බව පැවසූයෙන් තම සේනාව ආරක්ෂා කරගැනීමේ අරමුණින් ඩේවි මුත්තු සාමිව පාවා දුන්නේය[16] (Marshall, 1846). ඒ අනුව රජු ඇහැලේපොළ ලවා මුත්තු සාමිව ප්‍රශ්න කරවීමෙන් පසු ඔවුන් මරා දැමීමට තීරණය කෙරිණි. මුත්තු සාමිගේ මරණය 1803 ජූනි 27 සිදු විය. රජුගේ අණ අනුව ජා මුහුන්දිරම්වරයා මුත්තු සාමි සමඟ සිටි මහනුවර වැසියා උල හිඳුවා මරවා සෙසු පිරිස කිණිසිවලින් ඇණ ඝාතනය කළේය (Davy, 1821). 1810 නොවැම්බර් 26 වැනි දින පළමුවැනි අධිකාරම් ඉදිපත් කරන තොරතුරු අනුව මෙම සිද්ධිදාමය සිදුවී ඇත්තේ පහත ආකාරයෙනි. ඩේවි සුදු කොඩි එල්ලා සන්සුන් ලෙස කොළඹට ළඟා වීමට අවසර ඉල්ලා එය ලබා ගත් ආකාරය සහ එදින සවස මහනුවරින් පිටවී ගමන් කර, එදා රාත්‍රියේ වාකොළ විවේක ගත්තේය. පසු දින උදෑසන, 400ක් පමණ මැලේ හමුදාව පළමුවෙන් ම පසෙකට ගෙන්වා ආයුධ බිම දමා ඉවත යැවූහ. ඉන් පසුව (ඊළඟට) සිපෝයිවරුන්ට ද එලෙසින් ම කරන ලදී. ඉන් පසුව ප්‍රධානියා වූ මේජර් ඩේවි සහ තව 2නෙකු ගෙන්වූ අතර, අනෙකුත් සියලු සුදු මිනිසුන් කිසිවෙක් මඟ නොහැර සමූල ඝාතනය කිරීමට රජු අණ දුන්නේය. ඔවුන් මුලින් ම ආයුධ බිම තැබීමට නියම කර, එසේ කළ පසු, මරණයට පත් කරණ ලදී. ආවතේවකාර කළු මිනිස්සු 10ක් හෝ 12ක් පමණ ඉතිරි වූ අතර ඔවුහු අධිකාරමගේ පාමුල වැටී, ජීවිත දානය දෙන ලෙස ඉල්ලූහ. ඔහු ක්‍රියා කළ යුතු අන්දම පිළිබඳ උපදෙස් ඉල්ලා රජුට ලියූ අතර සියලු දෙනාට ම වෙඩි තැබීමට රජු නියම කළේය. එය එසේ ක්‍රියාත්මක කෙරිණි. (Diary of Mr. John D'Oyly, 1917). මෙම ඝාතනය පිළිබඳ ජෙෆ්රි පවෙල් සඳහන් කරන්නේ මහනුවරට නැගෙනහිරින් සැතපුමක දුරක සිට රජු වෙත පමුණු වන ලද මුත්තු සාමි හා ඔහුගේ නෑයන් තිදෙනා මූලික පරීක්ෂණයකින් පසු හිස ගසා මරා දැමූ අතර තවත් සේවකයන් හත් දෙනෙකුගෙන් දෙදෙනෙකු එල්ලා මරා දමා සෙස්සන්ගේ කන් නාසා කපා නිදහස් කරන ලද බවත්, ඔවුන් මාසය අවසානයේ ත්‍රිකුණාමලයට ළඟා වූ බවත් ය (Diary of Mr. John D'Oyly, 1917 ; Powell, 1973).

අප්‍රේල් 1 වන දින මැක්ඩොවල් මහනුවරින් පිට වන විට මැලේ සෙබළු 700ක් සිටි අතර ඇඩම් ඩේවි පසුබසින විට සිටියේ 250 කට අඩු පිරිසක් වන අතර බ්‍රිතාන්‍ය සෙබළු සිටියේ 100ක් පමණ ය (Marshall, 1846). ආරක්ෂක බලකොටුව සමඟ සිටි 19 වැනි රෙජිමේන්තුවේ ශල්‍ය වෛද්‍ය හොලෝවේ සහ මැලේ රෙජිමේන්තුවේ සහකාර ශල්‍ය වෛද්‍ය ගීවිං යන දෙදෙනා ද තම රෝගීන් අතහැර මේජර් ඩේවි සමඟ ගියේය (David, 1995).

19 වැනි රෙජිමේන්තුවේ කෝප්‍රල් බාන්ස්ලේ උපුටා දක්වමින් හෙන්රි මාෂල් සඳහන් කරන්නේ පසු බසින් ලද මේ පිරිසේ සිටි යුරෝපා සොල්දාදුවන්ට තමන්ගේ අවි ආයුධ අතහැරීමට සිදු වූ අතර මැලේ හා සිපෝයි සේනාව වරෙකට දෙදෙනා බැගින් පසෙකට රැගෙන ගොස් වෙඩි තබා ඝාතනය කළ බවයි[17] (Marshall, 1846). මේ අනුව බ්‍රිතාන්‍ය සේනා කාණ්ඩ කර ඝාතනය කිරීමක් සිදු විය. බ්‍රිතාන්‍ය නිලධාරීන් තිදෙනෙක් වෙන් වෙන්ව සිර ගත කෙරිණි (Marshall, 1846). පවෙල්ගේ වාර්තාවට අනුව මේ සිදුවීම වූ අකාරය තරමක් වෙනස් ය. ඒ අනුව මහනුවර හමුදාව බ්‍රිතාන්‍ය සේනාංකයන් අතරින් ආසියා සෙබළු වෙන් කර අගනුවරට කැඳවා ගෙන ගියහ. යුරෝපීය සෙබළු සිය නිලධරයන්ගෙන් වෙන් කර වෙනතක රැඳවීය. පසුව බ්‍රිතාන්‍ය සේනාව අතර පැවති වටිනා දේ පැහැර ගත් මහනුවර හමුදාව ගං ඉවුරේ පඳුරු ගොන්නකින් ආවරණය වුණු හිස් බිමක් වෙත වරකට සෙබළු යුගලයක් වශයෙන් ගෙන ගොස් මහනුවර සේනාවේ සිටි කාපිරි සෙබළුන්ගේ විශාල කඩු භාවිතයෙන් ශරීරය කොටස්වලට කපා ඝාතනය කළහ (Powell, 1973 ; A Burnell & H. Yule, 1903). මෙසේ ගෙන ගොස් ඝාතනය කළ යුරෝපීය හටයන් ප්‍රමාණය 34කි (Davide, 1995). බ්‍රිතාන්‍ය පාර්ශ්වයේ මැලේ නිලධර

---

[16] ඉන්දියාව පවා ජය ගැනීමට සමත් වූ නිර්භීත ඉංග්‍රීසීන් උඩරැටියන් ඉදිරියේ බියගුළුව තමා සහ අවි ආයුධ අතහරින්නේ යැයි මුත්තුසාමි මේ අවස්ථාවේ ඉංග්‍රීසීන්ට ම පැවසුවේය (Marshall, 1846)

[17] බ්‍රිතාන්‍ය සෙබළු මරා දැමීම සිදු වූ ආකාරය සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් බාන්ස්ලේගේ විස්තරයන් පදනම් කරගනිමින් හෙන්රි මාෂල් විසින් ගෙන එයි. *වැඩි විස්තර සඳහා බලන්න* (Marshall, 1846, Appendix No. IV)

ඔඩීන් (Odeen) යනු මෙලෙස ශරීරය කොටස්වලට කපා ඝාතනය කළ අයෙකි (Marshall, 1846). මෙම ඝාතන ක්‍රමය හේතුවෙන් ඇතැමෙක් ලාංකිකයන්ගෙන් ඝාතනය වීමට පෙර තම තුවක්කුවලින් තමන්ට ම වෙඩි තබා ගැනීම, 19 වන පාබළ සේනාංකයේ නිලධාරීන් දෙදෙනෙක් ගඟට පැන සිය දිවි හානි කර ගැනීම, බෙරි (barry) නැමති නිලධරයා ලාංකිකයෙකු අත තිබූ තුවක්කු පැහැරගෙන දිවි නසා ගැනීම සිදු විය. මීට පෙර වූ සටනේදී කලවයට හා පපුවට වෙඩි වැදී තුවාල ලබා සිටි ලුතිනන් බැලැක්නී (Blakeney) දෝලාවකින් මහනුවර නගරයෙන් පිටතට පැමිණෙද්දී ඔහුව දෝලාවෙන් පිටතට ගත් මහනුවර හමුදාව පොලුවලින් හිසට පහර දී මරා දැමූහ. මැරුම් කෑමට අවසාන වශයෙන් ඉතිරිව සිටි ඩේවි සහ රම්ලි (Rumley) යන දෙදෙනා මරා දැමීමට සැරසුණු කාපිරි සෙබළෙකු වැළකූ පිලිමතලව්ව ඔවුන් දෙදෙනා රජු වෙත යැවීය. මේ සම්බන්ධයෙන් කොඩ්රින්ටන් පෙන්වා දෙන්නේ මහනුවර හමුදාව ගඟින් එතෙර කරවීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකසන බව ඩේවිට සහ තවත් නිලධරයන් දෙදෙනෙකුට දන්වා, මුල්ලේගම, වෙල්ලස්සේ මිල්ලව දිසාව ඇතුළු තවත් ප්‍රධානියෙකු හරහා රජුට යොමු කිරීමෙන් පසු අත්තඩංගුවට පත් වූ බවයි (Diary of Jhon Mr. D'Oyly, 1917). මේ අනුව මෙම බ්‍රිතාන්‍ය නිලධරයන් දෙදෙනා මහනුවර හමුදාව විසින් නොමග යවා අත්තඩංගුවට ගෙන ඇති බව පෙනේ. දෙදෙනෙකු මහනුවර හමුදාවේ බේරීම සඳහා ගොඩැල්ලක් (කණ්ඩියක්) මතින් බිමට පහළට පැනීමෙන් වළකට වැටී දින කිහිපයක් ගතකොට මහනුවර මැලේ හට පිරිසක් මඟින් රජු වෙත භාර විය.[18] මේ දෙදෙනා සහකාර ශල්‍ය වෛද්‍ය ග්‍රීවිං සහ කපිතාන් හම්ප්‍රීස් ය (David, 1995). 1804 වන විට ග්‍රීවිං මුහුදුබඩට පලා ගිය අතර හම්ප්‍රිස් සිර අඩස්සියේදී ම මිය ගියේය. 19 වන මැලේ රෙජිමේන්තුවේ සහ 51 වැනි බෙංගාල කාලතුවක්කු නිලධාරීන්ගෙන් 11ක් ඝාතනය වූහ. නිලධාරීන් හැර යුරෝපීය බලඇණි සොල්දාදුවන් 300ක්, 19 වැනි රෙජිමේන්තුවේ මිනිසුන් 23 ක් තොටුපොළ අසළදී ඝාතනය වූ අතර ඉතිරි වූයේ එක් පුද්ගලයෙක් පමණි (David, 1995). මෙම ඉතිරි වූ පුද්ගලයා වූයේ කෝප්‍රල් ජෝර්ජ් බාන්ස්ලේ (George Barnsley) ය.

බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයන්ගේ අසරණ භාවයෙන් යුතු පරාජයත් මහනුවර රජු ඇතුළු හමුදාවේ අවස්ථාවෝචිත ක්‍රියා පිළවෙතත් මෙමඟින් පිළිබිඹු කරයි. මෙම පිරිසේ ඝාතනයන් උල තැබීමෙන් හෝ කිනිසිවලින් ඇණීමෙන් හෝ වෙඩි තැබීමෙන් සිදු විය. මේ අනුව බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ රාජ උරුමය පැවති පුද්ගලයෙක් රජ කරමින් මහනුවර රාජ්‍ය පාලනය තමන්ට රිසි සේ මෙහෙයවීමට ගත් ප්‍රයත්නය අසාර්ථ කරලීමට මහනුවර රජු ඇතුළ හමුදාව සමත් විය. එමඟින් ඩේවිගේ මහනුවර පහරදීමට සමගාමීව මහනුවර රාජ්‍ය උරුමය සම්බන්ධ මුත්තු සාමිට තිබූ අයිතිය අහිමි වී ගියේය. නැවත රාජ උරුමයක් දඩමීමා කරමින් මහනුවර බලය අල්ලා ගැනීමට තිබූ අවස්ථාව ද බ්‍රිතාන්‍යයන්ට ඇහිරී ගියේය. මහනුවර හමුදාව සංවිධානාත්මකව හා සැලසුම් සහගත පරිදි ඩේවිගේ නායකත්වයෙන් යුත් බ්‍රිතාන්‍ය සේනා මැඩලීම පිණිස අනුගමනය කළ විධික්‍රම පිළිබඳ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන්හි ඉදිරිපත් වන සිද්ධි සමග බැඳුණු තොරතුරු සුළු වෙනස්කම් සහිත වුව ද මහනුවර හමුදාවේ බ්‍රිතාන්‍ය සේනා පරාජය සහ ඝාතනයන් ඉතා සංවිධානාත්මකව සිදු වූවක් බව දක්නට ලැබේ.

**මැක්ඩොවල් කොටුවට අල්ලා ගැනීම**

යථෝක්තව සඳහන් කරන ලද පහර දීමේ දී දිවි රැක ගත් එකම බ්‍රිතාන්‍ය සෙබළා වූ කෝප්‍රල් බාන්ස්ලේ (Barnsley) (Powell, 1973) රජුගේ සෙබළුන්ගේ කඩු පහරකින් අනතුරට ලක් වී මහවැලි ගඟ තරණය කර සැතපුම් 13 ක් මඟ ගෙවා මැක්ඩොවල් කොටුව වෙත දැඩි දුෂ්කර ගමනක යෙදෙමින් සිටිය දී, මැක්ඩොවල් කොටුව (Fort Macdowall) අල්ලා ගැනීමට පිණිස ම ගමන් කරමින් සිටි සන්නද්ධ හමුදා භටයන් 5000ක පිරිසක් විසින් ප්‍රාණ ඇපකරුවෙකු බවට පත් කරගනු ලැබීම ය. උඩරැටියෝ තම ඉලක්කයන් වෙත පහර දීම සඳහා බ්‍රිතාන්‍ය සෙබළුන් ප්‍රාණ ඇපකරුවන්[19] ලෙස තබා ගනිමින් ඔවුන් සමඟ ම ගොස් බ්‍රිතාන්‍ය කඳවුරුවලට පහර දුන්හ. 5000ක පිරිස යමින් සිටියේ මේ වන විට මැක්ඩොවල් කොටුවට පහර දීම සඳහා ගොස් සිටි උඩරැටියන්ට ශක්තියක් වීම සඳහා ය. බාන්ස්ලේව උපක්‍රමික වශයෙන් ප්‍රාණ ඇපකරුවෙකු ලෙස භාවිත කිරීමට අදහස් කළ උඩරට හමුදාවේ නායකයා මලබාර් බසින් බාන්ස්ලේට දැනුම් දුන්නේ, බලකොටුවේ තාප්පවල රැකවරණයෙන් මෑත්ව එළිමහනේ දී උඩරැටියන් සමඟ සටන් වදින්න පැමිණෙන්න යැයි යෝජනාවක් සහිත පණිවුඩය කඳවුර තුළට රැගෙන යන ලෙසයි. මලබාර් භාෂාව තේරුම් ගැනීමට බාන්ස්ලේ සමත් වූ අතර ඒ අනුව හමුදා භටයන් දෙදෙනෙකු විසින් බලකොටුව පැවති කඳු ගැටය වෙත බාන්ස්ලේව කැඳවාගෙන ගොස්

---

[18] මොවුන් දෙදෙනා මෙම වල තුළ දින කිහිපයක් ගත කළේ කාපිරි සෙබළුන් විසින් මරා දමා වලට විසිකර දැමූ සිය සගයන්ගේ ම මළ මිනී සමඟය.

[19] සංග්‍රාමයක දී රජෙකු විසින් යටත් කරගන්නා ලද මිනිසුන් ''කරමාරනිතො'' ලෙස හඳුන්වයි.(මෙසූරියර්, සී.ජේ.ආර්.ලෙ. සහ පානබොක්ක, ටී.බී., 2009). ඇස්.බී. හෙට්ටිආරච්චි ඉන්දීය මූලාශ්‍රයන්හි සඳහන් වන ආකාරය පෙන්වා දෙමින් මෙම වචනය සඳහන් කර ඇත්තේ ''කරමාරානීතදාස'' යනුවෙනි (හෙට්ටිආරච්චි, 2008). කෙසේ හෝ මෙම වදනින් සටනක දී යටත් කොට ගෙන තමන් යටතේ තබා ගෙන සිටියවුන් හැඟවූ බවක් පෙනේ. මධ්‍යකාලීන ලංකාවේ ද යුද්ධයේ දී අල්ලා ගන්නා ප්‍රාණ ඇපකරුවන් වහලුන් ලෙස රජු යටතේ තබා ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක විය. ඇතැම් අවස්ථාවල මෙලෙස යුද්ධයෙන් අත්තඩංගුවට ගන්නා සිරකරුවන් දාසයන් වශයෙන් විහාරස්ථානයන්හි සේවයෙහි යොදවා තිබේ. ශිලාමේඝවර්ණ එලෙස දාසයන් ලෙස සිරකරුවන් විහාරස්ථානයට ලබා දුන් රජෙකි(මහාවංසය, 1963 ඃ 44/73)

කොටු පවුර පාමුල ඔහු රඳවා ආපසු ගියහ. බාන්ස්ලේ මහනුවර හමුදා නායකයාගේ නියෝග අනුව ක්‍රියාත්මක වෙමින් කොටුව වෙත ළඟා විය. ලාංකේය සටන් කරුවන් විසින් බාන්ස්ලේව මෙහි දී භාවිත කරනු ලැබුවේ මැක්ඩොවල් කොටුවේ සිටි සේනාව බිය වැද්දා තම අරමුණ ඉටු කර ගැනීමේ යටි අරමුණින් බව පැහැදිලි වේ. කොටුව තුළට ළඟා වූ පසු සිදු වූ සිදුවීම් පවෙල් මෙසේ වාර්තා කරයි. ''තමන් අභිමුවට පැමිණ වැරුණු සුදුමැලි පුද්ගලයාගේ බිහිසුණු විලාසයෙන් බිරාන්ත වූ රැකවලා, ඒ අවස්ථාවේ කොටුව භාරව සිටි කපිතාන් මැඩ්ගේ වෙත ඔහුව කැඳවාගෙන ගියේ ය. ආගන්තුකයාගේ විලාසයෙන් පමණක් නොව ඔහු විසින් ගෙනෙන ලද අතිශය ඛේදජනක තොරතුරුවලින් කපිතාන් තිගැස්සිණි. 'නුවර සිටි සේනාව සහමුලින් ම විනාශයි ස්වාමීණි! ඒ වචන කිහිපය ප්‍රථමයෙන් ම ඔහුගේ මුවින් පිටවුණි'' (Johnston, 1854 : Appendix pp.130-134 ; Powell, 1973). ඉබාගාතේ ඇවිදින්නන් විසින් නොයෙක් කටුක තොරතුරු පතුරතත් මොහු එවැන්නෙක් නොවන බව අවබෝධ කර ගත් 19 වැනි රෙජිමේන්තුවේ කපිතාන් එඩ්වඩ් මැජ්ගේ (Edward Madge) විසින් තමන් වෙත පැමිණි මෙම අමුත්තාගේ පුවත වහා සටහන් කර ගත්තේය. මේ වන විට මැක්ඩොවල් බලකොටුව තුළ මැජ්ගේ බලඅණියට අයත් නිලධරයෝ 3 දෙනෙක්, සැරයන්වරයෙක්, මැලේ හටයෝ 20 දෙනෙක් සහ 19 වැනි පාබළ සේනාංකයේ සෙබළු 30 දෙදෙනෙක් සිටියහ. මෙම 30 දෙනාගෙන් 19 දෙනෙක් රෝගීන් වූ අතර ඔවුන් කඳවුර තුළ ම අතහැර දමා යාමට මැජ්ගේ කටයුතු කළේය (David, 1999). මෙම කඳවුර තුළ වූ පිරිස සම්බන්ධයෙන් වෙනස් වූ වාර්තා දක්නට ලැබේ. ජොන්ස්ටන්ට අනුව මෙම රෝගීන්නේ සැලකිය යුතු පිරිසක් පැන ගොස් ඇත. මේ අතර ගත වූ තුන් දිනක් තිස්සේ මහනුවර හමුදාව විසින් බලකොටුව වටලා තිබූ අතර යුරෝපීය සෙබළුන්ට මහනුවර දී අත් වූ ඉරණම හා බලකොටුව අසළට මේ වන විට පැමිණ සිටින සේනාව ගැන බාන්ස්ලේ විසින් කපිතාන් මැජ්ගේට සැළ කිරීම මත කොටුව තුළ සිටි දුබල සෙබළුන් ගැන ද නොතකා කොටුවෙන් ඉවත් වීමට මැජ්ගේ තීරණය කළේය. සටනක් නොදී මානසික වියවුලකට පත්කොට බ්‍රිතාන්‍යන්ගේ සේනා මැක්ඩොවල් කොටුවෙන් ඉවත් කිරීමට ක්‍රියා කිරීම ලාංකේය සටන් කරුවන්ගේ උපක්‍රමික ක්‍රියාවලියේ තවත් අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. තම මහනුවර සේනාවේ අන්ත පරාජය සහ අසරණ භාවය සටනක් දියත් නොකොට පසුබසින්නට හේතු වූ බව පෙනේ. මහනුවර මාලිගය තුළ වූ රෝහලෙහි සිටි රෝගීන්ට මහනුවර හමුදාව සිදු කළ විපත පිළිබඳ බාන්ස්ලේගේ තොරතුරු මතින් මැජ්ගේ අවබෝධ කරගැනීම මෙම පසුබැසීමේ මානසිකත්වය වර්ධනය කරන්නට තවදුරටත් හේතු වන්නට ඇත. උඩරැටියන් රැවටීමේ අරමුණින් ලාම්පු දල්වා රෝගී සෙබළුන් ඔවුන්ගේ අවසානය බලාපොරොත්තුවෙන් ඇඳන් මත වැතිර සිටින අයුරු මහනුවර හමුදාවට පෙනීමට සලස්වා මැජ්ගේ ඇතුළු සේනාව හොර රහසේ කොටුවෙන් පිටතට රිංගා ගත්ත ද උඩරැටියෝ දින හතරක් තිස්සේ ඔවුන් ලුහුබඳිමින් සතුරන්ට පහර දුන්හ (Powell, 1973). මේ වන විට ත්‍රිකුණාමලයේ සිට දෝලා සියයකින් පැමිණි පිරිසත් ඔවුන්ට රැකවරණය සලසමින් පැමිණි 150 මැලේ සෙබළුන්ගේ ප්‍රහාරයත් නිසා මැජ්ගේ සේනා පසු පස හබායමින් සිටි උඩරැටියන්ට පසු බසින්ට සිදු වූ අතර මැජ්ගේ ඇතුළු සේනාව සත් දිනකින් ත්‍රිකුණාමලයට ළඟා වූහ. කෝප්‍රල් බාන්ස්ලේගේ ජීවිතය රැකුණු අතර බ්‍රිතාන්‍ය පරිපාලනය විසින් ඔහු සැරයන් ධූරයට උසස් කරනු ලැබුව ද පසු කලෙක ඔහු බැරැක්ක මුර පොළෙහි බීමත්ව කටයුතු කිරීම නිසා තනතුරෙන් පහත දමා සාමාන්‍ය සෙබළෙකු තත්ත්වයට පත් කරනු ලැබීය. ක්‍රි.ව. 1805 දී ගිලන් වූ ඔහු පිළිබඳ නැවත වාර්තා වන්නේ වසර 6කට පසු ජෝර්ජ් බලකොටුවේ ප්‍රවීණ සෙබළෙකු වශයෙන් සේවය කරමින් සිටිය දී ය. 1803 ජූලි 2 වන (Diary of Mr. John D'Oyly, 1917) විට කිසිදු බ්‍රිතාන්‍යයෙක් කන්ද උඩරට නොමැති විය. මෙය බ්‍රිතාන්‍යයන් ඉතාම කලාතුරකින් අත්දුටු අන්දමේ විනාශයක් විය.

**ඇඩම් ඩේවිගේ මරණය**

මහනුවර හමුදාව වර්ධනය කර ගැනීමට මහනුවර පරිපාලකයෝ ගත් උපක්‍රමික පියවරක් වූයේ අත්ඩංගුවට ගත් ආසියා සෙබළු හමුදා සේවයට බඳවා ගැනීමයි. ඊට අකමැති වූ බ්‍රිතාන්‍ය පාක්ෂික සෙබළු ඝාතනය කෙරිණි. ඩේවිගේ සේනාවේ සිටි බ්‍රිතාන්‍ය හමුදාවන්ගෙන් වෙන් කොට අත්අඩංගුවට ගත් බෙංගාලි තුවක්කුකරුවෝ සහ මැලේ හටයෝ බ්‍රිතාන්‍ය මහා රාජ්‍යයට සේවය කරන්නට දිවුරුම් දී ඇති බවත් රාජ්‍ය දෙකකට සේවය කරන්නට නුපුළුවන් බවත් ප්‍රකාශ කිරීම නිසා මහනුවර හමුදාව අතින් ඝාතනය විය (Powell, 1973). ඩබ්ලිව් අප්පුගේ සඳහනක් පාදක කරගනිමින් ඩොයිලි මැලේ සහ සිපෝයි සෙබළුන්ගේ ඝාතනය වීම ඔවුන් වෙන් කර සිදු කළ බව පෙන්වා දීම තුළින් මහනුවර හමුදාවේ විසින් අනුගමන කළ සතුරා ඛණ්ඩගත කර ඝාතනය කිරීමේ ක්‍රමවේදය තවදුරටත් සනාථ කරයි (Diary of Jhon Mr. D'Oyly, 1917). ආසියා සෙබළුන්ගෙන් ඇතැමෙක් උඩරැටියන් සමඟ එක් වූ අතර ඇතැම් විදේශික සෙබළු කිසිදු විරෝධතාවයකින් තොරව තමන්ට පක්ෂපාත කර ගැනීමට මහනුවර හමුදාව සමත් වූහ. මෙයින් බ්‍රිතාන්‍ය බලඇණි දුර්වල වූවා මෙන් ම ලාංකේය සේනා ශක්තිමත් වීම ද සිදු විය. ඩේවි ඇතුළු පිරිස පසුබසින විට බ්‍රිතාන්‍ය සෙබළුන් ඉතිරිව සිටියේ 100ක් පමණ ය (Marshall, 1846). රාජකීය සේනා සමඟ බ්‍රිතාන්‍ය පාක්ෂික සෙබළු එක් වීමට රජුගේ හමුදාවේ සිටි සන්ගන්ග්ලෝ ඇතුළු මැලේ හට පිරිසේ රාජපාක්ෂික භාවය ද හේතු විය. මැලේ සේනාංකයේ කපිතාන් නෞරදීන්ගේ සහෝදරයා සහ අනෙක් සෙබළු ඝාතනය නොකර රජු ඉදිරියට පැමිණ වූ අවස්ථාවේ ඔවුන් රජු ඉදිරියේ බිම දිගා වී නොව

තම හමුදා පිළිවෙත අනුව ගෞරව කිරීම පිළිබඳව රජු උරණ වුව ද එකී දැඩි ප්‍රතිපත්තිමය ලක්ෂණය හේතුකොටගෙන ම සිය මැලේ හමුදාවේ නායකත්වය භාර ගන්නා ලෙස නෞරදීන්ට නියෝග කළේය. ඔවුන්ගේ අදහස වෙනස් වේ යැයි බලාපොරොත්තුවෙන් නෞරදීන් සහ පිරිස අගෝස්තු මැද වන තෙක් සිර අඩස්සියේ තැබීමට රජු නියම කළ ද එම කාලය අවසානයේ රජු යළිත් වරක් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම මත ඔවුන් මරා සිරුර සතුන්ට ආහාර පිණිස කැලයට දැමීය. බ්‍රිතාන්‍ය සේනාවේ නිලධරයන් සහ සොල්දාදුවන් මහනුවර හමුදාවේ සේවය සඳහා යොදා ගැනීමට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විවිධ උපක්‍රම භාවිත කර ඇති බව මෙම සිදුවීම මඟින් පෙන්නුම් කරයි. රම්ලි සහ හම්ප්‍රිස් යන දෙදෙනාට අත් වූ ඉරණම කෙබඳු වූයේ ද යන්න පැහැදිලි නැත. බොහෝවිට මොවුන් දෙදෙනා රෝගාබාධ මත හෝ ඝාතනය කිරීම මත ජීවිත අවසන් වන්නට ඇතැයි ඇතැමුන් අදහස් කරයි (David, 1995).

ඩේවි ප්‍රමුඛ බ්‍රිතාන්‍ය සේනාංකයන්ගේ දරුණු පරාජයට රජුගේ හමුදාවේ සිටි මැලේ මුහන්දිරම්ගේ මෙන් ම ඔත්තුකරුවෙකු වූ මනිසේරම්ගේ ක්‍රියා කලාපය ද හේතු විය. බ්‍රිතාන්‍ය යුද බලඇණිවලින් මැලේ සොල්දාදුවන් සහ සිපෝයිවරු ඉවත් කිරීමේ අරමුණින් ඔවුන් පැන යාමට පෙළඹවීමක් මැලේ මුහන්දිරම් සහ මනිසේරම් විසින් සිදු කරනු ලැබීය (Davy, 1821). මෙසේ බ්‍රිතාන්‍ය සේනාංකයන්හි හමුදා නිලධරයන්ගෙන් සොල්දාදුවන් වෙන් කර ගණපූර්ණය අඩු කරමින් සේනා බලය බිඳ දැමීම මහනුවර හමුදාවන්ගේ මූලෝපායේ තවත් පියවරකි. බ්‍රිතාන්‍යයන්ට හිතවත් සේනාංක එම පක්ෂපාතිත්වයෙන් මුදවාලීම මෙමඟින් සිදු විය. රට අභ්‍යන්තරයෙන් බ්‍රිතාන්‍යයන් නෙරපා දැමීමෙන් නතර නොවූ මහනුවර හමුදාව බ්‍රිතාන්‍යයන් පලවා හැරීමේ අපේක්ෂාවෙන් අගෝස්තු, සැප්තැම්බර් මාසවල කොළඹට ආසන්න හංවැල්ල ආරක්ෂක මුරපොළ දක්වා ප්‍රහාර දියත් කළ ද එය සාර්ථක නොවීය.

1803 ඇඩම් ඩේවිගේ පරාජයට මැලේ භටයින්ගේ අතහැර යාම පමණක් නොව පිළිමතලව්වට රැවටුණු නෝර්ත් ආණ්ඩුකාරයාගේ ක්‍රියා කලාපය ද හේතු විය. ඒ බව ඇඩම් ඩේවිගේ ලිපි මඟින් හෙළි වේ. ''ආණ්ඩුකාරු අදිකාරම්ගේ උපදෙස්වලට රැවටී තම භට පිරිස රැකඩ මෙන් මෙවර පාවා නොදෙනු ඇතැයි මා බලපොරොත්තු වෙනවා. මහනුවරදී සිදු වූ සියලු දෙය ම කළේ පළමුවැනි අදිකාරම් ය. ප්‍රහාරයට පෙරදින රාත්‍රියේ නොමඟ යැවීමට මිත්‍රශීලී ලිපියක් එවා පසු දින උදෑසන ප්‍රහාරය මෙහෙය වූයේ ඔහුම ය. මැලේ භටයින් ද්‍රෝහීව, විශ්වාසය කිරීමට ද නොහැකි ආකාරයෙන් අප අතහැර ගොස් මරණයට මුහුණ පෑවේද මොහුගේ මනෝරථය නිසාම ය''[20] (Maitland to Earl Camden, 22nd Nov., 1805. C.O. 54/18; Pieris, 1939). සටන් උපක්‍රමයක් වශයෙන් සතුරන් නොමග යැවීමේ ලිපි භාවිතය මහනුවර ප්‍රධානීන් යොදා ගත් බව ඩේවිගේ මෙම සටහන අනුව අනාවරණ වේ. ඇඩම් ඩේවි අඛණ්ඩව රජුගේ සිර භාරයේ විසුවේය. ඩේවි මුදා ගැනීම සඳහා අසනා නැමති මැලේ මුහන්දිරම් උපයෝගී කරගැනීම වැනි විවිධ ප්‍රයත්න දැරුව ද ඒවා අසාර්ථක විය (Pieris, 1939). මේ අනුව ඩේවි රජුගේ සිර භාරයේ තබා දැඩි රැකවල් දැමීය. විදේශීය හමුදා නිලධාරීන් අල්ලා ගත් විට ඔවුන්ට විශේෂ අනුග්‍රහයක් දැක්වීම ලාංකේය රජවරුන්ගේ පුරුද්දක්ව පැවති අතර ඉන් ඔවුන් බලාපොරොත්තු වූයේ එම නිලධාරීන් තම සේවයට පොළඹවා ගැනීම ය.[21] එවැන්නකට ඩේවි පොළඹවා ගැනීමට රජු කටයුතු කළේය. සිර අඩස්සියේ සිටින මුල් කාලයේ රජු මොහුව හාමතේ සිටින තරමට නොසලකා හැරිය[22] ද පසුව ඔහු පිළිබඳ රජුගේ මනෝභාවය වෙනස් වී ඔහුට තෑගිබෝග මිල මුදල් ආදිය ලබා දුන් අතර රාජධානිය තුළ කරත්ත මඟින් කෙරුණු ප්‍රවාහන සේවයේ නායකත්වය වන මඩිගේ දිසාව නම් තනතුර ද පිරිනැමුණේය (Diary of Mr. John D'Oyly, 1917). මෙවැනි වරප්‍රසාද ලබා දුන් පසු ඩේවිට තම හමුදාවට බැඳී සේවය කරන ලෙස රජු ඉල්ලූ විට ඩේවි ඊට කැමැත්ත පළ කළේය. ඔහුට කොළඹ බ්‍රිතාන්‍යයන් සමඟ සටන් වැදීමට සිදුවන බව ද එවිට බ්‍රිතාන්‍යයන්ට හසු වුවහොත් තමාට මරණය හිමිවන බවට ද කරුණු පහදා දුන් රජු ඇමතිවරුන් සමඟ සාකච්ඡා කර ඩේවිගේ පක්ෂපාතිත්වය අගය කරමින් රන් දම්වැලක් හා කඩුවක්, සිංහල රුපියල් සහ රිදී රුපියල් දී ඔහුගේ නවාතැන්පොළෙහි රැඳවූ බව 1805 මාර්තු 5 නෝර්ත් විසින් කැම්ඩන්ට යවන ලිපියෙන් අනාවරණය වේ (Pieris, 1939). තම පක්ෂයට යොමු කර ගත් බ්‍රිතාන්‍ය නිලධාරියෙකු සඳහා රන් දම්වැලක් හා කඩුවක් පිරිනැමීම ම රජු කළ අභිප්‍රේරණ කටයුත්තක් ලෙස සැලකිය හැකිය.

---

[20] තෝමස් මේට්ලන්ඩ්ගේ විමර්ශනයට අනුව ඩේවිගේ පළමු ලිපියෙන් ම අනාවරණය වන්නේ මෙම ඝාතනයේ වගකීම මුළුමනින්ම මැලේවරු වෙත පවරා ඇති බවයි.

[21] හංවැල්ල ප්‍රහාරය අවස්ථාවේ මිය ගිය බෙන්සන් සිය හමුදාවට ද්‍රෝහී වී සිංහල හමුදාවට එකතු වූ මද්‍රාසි කාලතුවක්කු හමුදාවේ සිටි ඉංග්‍රීසි ජාතිකයෙකි. රජතුමා විසින් ඔහුට පරිත්‍යාග කරන ලද රන් දම්වැලක් ද කරේ දමා ගෙන රිදී මිටක් සහිත කඩුවක් ඉනේ පැළඳගෙන යුහුසුළුව සේවය කරමින් සිටිය දී ලැබූ තුවාල නිසා ඔහු හංවැල්ලේ දී මිය ගියේය (තලගම උන්නාන්සේගේ වාර්තාව - Pieris, 1939).

[22] සිර අඩස්සියේ සිටි සමයේ ඩේවි විදි කටුක අත්දැකීම් අති බහුතරයක් බව ඔහුගේ ලිපි මඟින් පැහැදිලි වේ (*වැඩි විස්තර සඳහා බලන්න* 1812 මාර්තු 29 බ්‍රවුන්රිග් විසින් ලිවර්පූල් වෙත යැවුණු ලිපිය - C.O. 54/43; Pieris, 1939).

කන්ද උඩරැටියෝ සිදු කළ සමූල ඝාතනයෙන් පසු කිහිප දෙනෙක් ඉතිරිව ඇති බව ආරංචි වීම මත 1805 වන විට නෝර්ත් ආණ්ඩුකරුගේ අනුප්‍රාප්තික තෝමස් මේට්ලන්ඩ් විසින් කුරුළු පිහාටුවක සඟවන ලද රහසිගත පණිවුඩයක් ලෙස මහනුවරට යවනු ලබන ප්‍රශ්න සඳහා[23] 1805 නොවැම්බර් මසදී ලියන ලද ඩේවිගේ පිළිතුරු ලිපිය මඟින් බ්‍රිතාන්‍ය සේනාංකයන්හි ඉතිරිව සිටියවුන් මිය ගිය බවත්, ඇතැමෙක් නිරාහාරව තබා මරා දමන ලද බවත් අනාවරණය වේ. "මේජර් ඩේවි නැමති මා පමණක් හැර මා දන්නා වෙනත් කිසිවෙක් නැත. අනෙක් සියලු දෙනා මරා දමන ලදහ. මිය ගියහ. කුස ගින්නේ මැරෙන්නට හරින ලදහ. මම, මහනුවරට සැතපුම් දහයක් පමණ නැගෙනහිර දෙසින් ගඟේ උතුරු පැත්තේ, කරල්ලියද්දෙහි, කුසට අහරක් හෝ ගතට ඇඳුමක් හෝ නැතිව සිටිමි...මහනුවරට අතගැසිය යුත්තේ එය සහමුලින් විනාශ කරනු පිණිස ම පමණකි...මගේ රටේ මිනිසුන් මහනුවරට එන විට මා මරා දමන්නට නියමිතව තිබෙන බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් කරුණු මා සතුව තිබේ (Powell, 1973). කිසියම් ලෙසකින් බ්‍රිතාන්‍යයන් උඩරට ආක්‍රමණය පිණිස පැමිණෙන්නේ නම් තමන්ගේ ජීවිතය පළමුව මහනුවර හමුදාව අතින් විනාශ වන බව ඔහු දන සිටි බව ද, නිරාහාරව තබා සතුරන් ඝාතනය කිරීමේ ලාංකිකයන්ගේ විධික්‍රමයක් වූ බව ද ඩේවිගේ සඳහනින් පැහැදිලි වේ. ජීවතුන් අතර සිටි එකම සිරකරුවා ඩේවි පමණක් බව බ්‍රිතාන්‍යයෝ පිළිගත්හ (Pieris, 1939). ඩේවි නිදහස් නොවීය. ඩේවි ලබා ගැනීම සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී මැක්ඩොවල් සහ නෝර්ත් ආණ්ඩුකාරයා උත්සාහ කළ ද මහනුවර රජු වෙතින් ඒ සියල්ල ප්‍රතික්ෂේප විය. ඩේවි මහනුවර නගරයේ තබා ගැනීමට හේතු වූයේ ඔහු විවාහ වී දරුවන් සිටීම මත වූ දාරක සම්බන්ධතාවක් නිසා හෝ ඔහුගේ හැසිරීම සහ තීරණ ගැනීම සම්බන්ධයෙන් ඇති වූ දුෂ්කරතාවක් නිසා ද යන්න විවාදාත්මක වන අතර 1812/13 කාලයේදී උදර රෝගයෙන් ඔහු මිය ගිය බවට ද අදහස් ඉදිරිපත් වේ (David, 1995). පවෙල් පෙන්වා දෙන්නේ 1812දී හෝ 1813දී රක්ත හීනතා රෝගයකින් ඩේවි මිය ගිය බවයි (Powell, 1973). අවස්ථා ගණනාවකදී ඩේවිගේ දිවියේ තත්ත්වය පිළිබඳ ඩොයිලි (1917) වාර්තා කරයි. ගොඩමුන්නේ උන්නාන්සේ ඩොයිලිට වාර්තා කරන පරිදි මේජර් ඩේවි ගංගාරාමය අසළ තල්වත්තේදී මරණයට පත් කරනු ලැබිණි[24] (Diary of Mr. John D'Oyly, 1917).

**බ්‍රිතාන්‍ය හමුදාංක ඝාතනය පිළිබඳ සංඛ්‍යා දත්ත විශ්ලේෂණය**

1803 සටනේදී ඝාතනය වූ බ්‍රිතාන්‍යය සේනාංකයන්හි සෙබළුන්ගේ මළ සිරුරු රැගෙනවිත් වාගොල්ලේපිටියට දැමීම නිසා එය මිනී කදන් සහිත සොහොනක් බවට පරිවර්තනය විය (ඉංග්‍රීසි හටන, 2001 : කවි 168-170). ඒ අනුව බ්‍රිතාන්‍ය සෙබළුන්ගේ ඝාතනය අතිවිශාල බව පැහැදිලි වේ. බ්‍රිතාන්‍යයන්ගේ ඝාතනය වීම් සම්බන්ධයෙන් කපිතාන් බුෂේ විසින් සංග්‍රහ කර ඇති දත්ත අනුව 1803 සිදු වූ මරණ සංඛ්‍යාව පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගත හැකි වේ (වගු අංක 01).

**වගු අංක 01: 1803 මහනුවර ඇතුළු වූ සේනාංකයන් සහ මරණ පිළිබඳ සංඛ්‍යා**

| Regiments and Corps. | Average Strength of Regiments. | | | Average Strength of the Troops that entered Kandy. | | | Deaths from the 1st of January to 30th of June 1803. |
|---|---|---|---|---|---|---|---|
| | Ser-geants. | Drum-mers. | Rank and File. | Ser-geants. | Drum-mers. | Rank and File. | |
| Bengal and Madras Artillery .... | 7 | 4 | 106 | 4 | 4 | 60 | 46 |
| Do. .. do. Gun Lascars. | 14 | — | 386 | 7 | — | 254 | 18 Returns for May and June wanting. |
| H. M. 19th Regiment.......... | 49 | 22 | 751 | 31 | 12 | 537 | 175 |
| Do. 51st do.............. | 51 | 22 | 547 | 36 | 12 | 442 | 214 |
| Do. 65th do.............. | 10 | 9 | 152 | 6 | 3 | 90 | 93 |
| Malay Regiment.............. | 51 | 21 | 885 | 30 | 18 | 620 | 80 |
| Sepoy Regiment.............. | 95 | 38 | 1,712 | 55 | 22 | 1,049 | 458 |
| Pioneer Lascars .............. | 9 | — | 251 | 5 | — | 171 | 7 { Returns for February, March, and April, wanting. |
| TOTAL.......... | 286 | 116 | 4,790 | 174 | 71 | 3,213 | 1,091 |

| | Officers. | Serg. | R. & F. |
|---|---|---|---|
| N. B.—Of the Bengal Artillery were murdered after Major Davies' Capitulation .............. | 1 | 1 | 6 |
| — H. M. 19th Regiment.............. | 7 | 9 | 65 |
| — the Malay Regiment .............. | 6 | 24 | 542 |
| — Gun Lascars [no Return]. | | | |
| TOTAL........... | * 14 | 34 | 613 |

* This total is not included in the foregoing Return of Deaths, and most of the native soldiers, returned murdered, joined afterwards their regiment.

**මූලාශය( Letters on Cevlon. 1817**

[23] ඔබ ඇතුළු කී දෙනෙක් ද? ඔබගේ නම? අනෙක් අයගේ නම්? සිටින්නේ කෙබඳු තත්ත්වයක ද? යන ප්‍රශ්න මෙම ලිපිය මඟින් අසා තිබේ.

[24] ඩේවි සහ කොළඹ අතර පණිවිඩ හුවමාරුවක් පිළිබඳ සඳහන් වූ පැමිණිල්ලක් ලැබීමෙන් මහනුවර සිටි ලන්දේසි ජාතිකයා, ලාලා හා කුට්වාල් මහනුවරදී අල්ලා නුවරින් පිටතට ගෙන යන ලද අතර ඉන් පසු ඔවුන් පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි පරිදි අතුරුදහන් කළ බවක් ද (Diary of Mr. John D'Oyly, 1917) ලන්සි ජාතිකයා, මලබාර් ලාලා හා ඩේවිගේ නිවසේ පදිංචිව සිටි ගමරාල යන්නවුන් බෝගම්බරදී මරණයට පත් කරන ලද බව ඩොයිලිගේ සටහන් අනුව අනාවරණය වේ (Diary of Mr. John D'Oyly, 1917).

ඉහත වගු අංක 1 මඟින් ඉදිරිපත් වන්නේ 1803 දී ලංකාවේ සේවයේ යෙදුණු රෙජිමේන්තු සහ හමුදා සේනාංක සහ සිදු වූ මරණ පිළිබඳ සංඛ්‍යා දත්තයන් ය. 1803 සටන ශක්තිමත් කිරීම සඳහා රෙජිමේන්තුවකට සාජන්වරු, බෙරකරුවෝ සහ සමාන්‍ය සෙබළ ශ්‍රේණි සහ පන්ති ඇතුළත් විය.

වගු අංක 1 අනුව 1803 දී රෙජිමේන්තු 7ක් සහ පුරෝගාමී ලස්කිරිඤ්ඤ හමුදාවක් මහනුවරට රාජ්‍ය ඇතුළු විය. එනම්, බෙංගාල සහ මදුරාසි කාලතුවක්කු රෙජිමේන්තුව, බෙංගාල හා මදුරාසි ලස්කිරිඤ්ඤ තුවක්කු හමුදාව, 19 වැනි රාජකීය රෙජිමේන්තුව, 51 වැනි රාජකීය රෙජිමේන්තුව, 65 වැනි රාජකීය රෙජිමේන්තුව, මැලේ රෙජිමේන්තුව, සිපෝයි රෙජිමේන්තුව සහ පුරෝගාමී ලස්කිරිඤ්ඤ හමුදාව ය. මේ අතරින් 19වැනි, 51වැනි සහ 65වැනි රෙජිමේන්තු යනු රාජකීය රෙජිමේන්තු ය. මේ අතුරින් සාජන්වරු, බෙරකරුවන් සහ සෙබළ ශ්‍රේණි සහ පන්තිවලට අදාළව වැඩිම සාමාජිකයන් ප්‍රමාණයක් ඇත්තේ සිපෝයි රෙජිමේන්තුව සතුව ය. එම ප්‍රමාණය පිළිවෙළින් 95, 38 සහ 1712 ක් වේ. මේ කාණ්ඩ 3ට අදාළව අවම සංඛ්‍යාව ඇතුළත්ව ඇත්තේ බෙංගාල සහ මදුරාසි කාලතුවක්කු හමුදාවේ ය. මෙම සියලු රෙජිමේන්තුමේන්තු සතු වූ ශ්‍රේණි සහ පන්තිවල සෙබළ සංඛ්‍යාවේ සාමාන්‍ය අගය 4790 කි. එම ප්‍රමාණය සාජන්වරු සහ බෙරකරුවන්ගේ එකතුව සමඟ විමර්ශනය කළහොත් මෙම රෙජිමේන්තු සතුවූ බලමුළු ශක්තියේ සාමාන්‍ය අගය 5192 කි.

මහනුවර ඇතුළු වූ සාජන්වරු සහ සොල්දාදුවන්ගේ සාමාන්‍ය අගය 3387 කි. බෙරකරුවන් 71කි. රෙජිමේන්තු සතු වූ බෙරකරුවන් සහ මහනුවර ඇතුළුවූ බෙරකරුවන් සංඛ්‍යාව 187කි. මහනුරවරට ඇතුළු වූ රෙජිමේන්තු සේනාංකයන් අතරින් වැඩි ම ශ්‍රේණි සහ පන්ති සෙබළ සංඛ්‍යාවක් සතු වූයේ සිපෝයි රෙජිමේන්තු සතුව ය. යුද සමයේ මහනුවරට ඇතුළු වූ වැඩිම සාමාජිකයන් පිරිසක් අනුයුක්තව සිටියේ සිපෝයි රෙජිමේන්තුව සතුව ය. එම සංඛ්‍යාවේ සාමාන්‍ය අගය 1049 කි. සංඛ්‍යාත්මකව දෙවන වැඩිම සාමාජිකයන් සමන්විත වූයේ මැලේ රෙජිමේන්තුව සතුව ය. එහි සාමාන්‍ය අගය 620කි. මහනුවරට ඇතුළු වූ රාජකීය රෙජිමේන්තුවල සේනා ශක්තියේ සාමාන්‍ය අගය 1069කි.

මේජර් ඩේවිගේ යටත් වීමෙන් පසු ජනවාරි 1 වන දින සිට ජූනි 30 වන දින දක්වා මිය ගිය සංඛ්‍යාව 1091 කි. මේ අතරින් වැඩිම සංඛ්‍යාව ලෙස 458 මිය ගොස් ඇත්තේ සිපෝයි රෙජිමේන්තුවට අනුයුක්තව සිටි සෙබළුන්ගෙන් ය. 51වැනි රාජකීය රෙජිමේන්තුවේ සෙබළු 214ක් ද, 19වැනි රාජකීය රෙජිමේන්තුවේ සෙබළු 175ක් ද මිය ගොස් ඇත. ලස්කිරිඤ්ඤ තුවක්කු හමුදාවේ කිසිවෙකු මහනුවර සිට නැවත කොළඹට ගොස් නැත.

හෙන්රි මාෂල්ගේ සංඛ්‍යා ලේඛනයට අනුව මහනුවර සහ ත්‍රිකුණාමලයේ අනුයුක්තව සිටි 19වැනි රෙජිමේන්තුවේ සොල්දාදුවන්ගෙන් වැඩිම ප්‍රමාණයක් මිය ගොස් ඇත්තේ 1803 වසරේදී ය. ඒ අනුව එම වසරේ 19වන රෙජිමේන්තුවෙන් යෙදවූ හමුදා ශක්තියේ මධ්‍යන්‍ය අගය 843ක් ද, මරණ 338 ද, 1000කට මරණ අනුපාතය 400ක් ද වේ (වගු අංක 02). 1796 සිට 1819 දක්වා සිදු වූ මරණ සංඛ්‍යාව සැලකීමේදී 19 වන රෙජිමේන්තුවට සම්බන්ධව සිටි සොල්දාදුවන් අතරින් වැඩිම සංඛ්‍යාවක් මරණයට පත්ව ඇත්තේ 1803 වසරේදී ය. 400ක අනුපාතය 1796 සිට 1819 දක්වා වසරවල සිදු වූ මරණ අනුපාතය සැලකීමේදී වැඩි ම මරණ අනුපාතයයි. මෙම සංඛ්‍යා ලේඛනයට අනුව 1803 වසරේ සිදු වූ මරණ සංඛ්‍යාව වර්ෂ 1796 මුහුදු සීමාව තුළ, සුබපැතුම් තුඩුවේ සහ කොළඹ සිදු වූ මරණ සංඛ්‍යාවට වඩා 16ක ගුණයක වැඩි වීමකි. පළමු නිදහස් සටන සිදු වූ 1818 වසර ම සාපේක්ෂව සැළකුවහොත් 1803 මරණ අනුපාතය දෙගුණයකට වඩා වැඩි වීමකි. කපිතාන් එල් ද බුෂේගේ සහ හෙන්රි මාෂල් ඉදිරිපත් කරන සංඛ්‍යා දත්ත අනුව ද විශ්ලේෂණය කළ හැක්කේ මහනුවර යුද්ධයට ප්‍රවිශ්ඨ වූවන්ගෙන් සැලකිය යුතු බ්‍රිතාන්‍ය සෙබළ පිරිසක් මිය ගිය බවයි. ඓතිහාසික මූලාශ්‍රය මඟින් ඉදිරිපත් වන ගුණාත්මක සාධක මෙම සංඛ්‍යාත්මක දත්ත මඟින් වැඩිදුරටත් තහවුරු වේ.

වගු අංක 02: හෙන්රි මාෂල් වාර්තා කරන මරණ අනුපාතය

| Years. | Mean strength. | Deaths. | Proportion of Deaths per 1000. | Where employed. |
|---|---|---|---|---|
| 1796. | 1035 | 20 | 19 | At sea, Cape of Good Hope, and Colombo, Ceylon. |
| 1797. | 1030 | 46 | 44 | Colombo. |
| 1798. | 1002 | 26 | 25 | Colombo. |
| 1799. | 941 | 90 | 95 | Colombo; 5 companies on service in India. |
| 1800. | 882 | 72 | 81 | Trincomalee. |
| 1801. | 854 | 39 | 46 | Trincomalee. |
| 1802. | 905 | 46 | 50 | Trincomalee. |
| 1803. | 843 | 338 | 400 | Kandy and Trincomalee. |
| 1804. | 642 | 128 | 199 | Trincomalee. |
| 1805. | 528 | 44 | 83 | Trincomalee. |
| 1806. | 451 | 12 | 26 | Colombo. |
| 1807. | 793 | 20 | 25 | Colombo. |
| 1808. | 828 | 17 | 20 | Colombo. |
| 1809. | 796 | 45 | 56 | Peninsula of India. |
| 1810. | 776 | 39 | 50 | Colombo. |
| 1811. | 729 | 17 | 23 | Colombo. |
| 1812. | 785 | 14 | 17 | Colombo. |
| 1813. | 938 | 20 | 21 | Colombo. |
| 1814. | 910 | 67 | 73 | Trincomalee. |
| 1815. | 1142 | 114 | 99 | Trincomalee. |
| 1816. | 1019 | 38 | 37 | Trincomalee. |
| 1817. | 930 | 91 | 97 | Trincomalee. |
| 1818. | 748 | 114 | 152 | Kandyan provinces. |
| 1819. | 598 | 41 | 58 | Kandyan provinces and Galle. |
| Total, ... | 20,105 | 1498 | | |
| Average, | 837 | 63 | 76 | |

මූලාශ්‍රය **( Ceylon, 1821**

බ්‍රිතාන්‍යයන් ''සමූල ඝාතනය'' කරමින් ලබන ලද මහනුවර හමුදාවේ මෙම ජයග්‍රහණයේ ගෞරවය ශ්‍රී ලාංකිකයන්ට ලබා දීමට නෝර්ත්ගේ අනුප්‍රාප්තික තෝමස් මේට්ලන්ඩ් අකමැති විය. ඒ අනුව ඔහු සමූල ඝාතනය නැමැති වචනය හිතාමතාම බැහැර කළේය. එම වචනය ඉවත් කළ බව මේට්ලන්ඩ් විසින් ම කැම්ඩන් වෙත ලිපියක් යවමින් කරන දැනුම් දීමෙන් අනාවරණය වේ (Maitland to Earl Camden, 22nd Nov., 1805. C.O. 54/18; Pieris, 1939). මහනුවර මාලිගය නිදහස් කරගැනීම සඳහා මහනුවර හමුදාව බ්‍රිතාන්‍ය සෙබළුන් ඝාතනය කිරීම හේතුවෙන් ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිගේ නියෝගයෙන් මෙම ගොඩනැගිල්ල බිමට සමතලා කොට එය පිහිටි තැන ටැබක් නැංවීමේ අදහස ප්‍රකාශයට පත් විය (Letters on Ceylon, 1817). ඇඩම් ඩේවිගේ නායකත්වයෙන් යුත් යුද පරාජයෙන් බ්‍රිතාන්‍යයන්ට වූ දරුණු විනාශය සහ හිත් රිදීම් දිගුකාලීනව බලපැවැත්වූ බව බ්‍රවුන්රිග්ගේ උක්ත නියෝගය මගින් ගම්‍ය වේ. ඇඩම් ඩේවිගේ නායකත්වයෙන් සිදු වූ මහනුවර යුද්ධය බ්‍රිතාන්‍ය සේනාවන්ගේ සමූල ඝාතනයෙන් කෙළවර වූ බවට නිශ්චය කළ හැකි ඓතිහාසික සාධක ලැබේ.

**සමාලෝචනය**

ලංකාවේ බ්‍රිතාන්‍ය හමුදා රෙජිමේන්තු සහ මහනුවර රාජ්‍යයේ හමුදාව අතර 1803 යුද්ධයක් සිදු විය. මෙය ලංකාවේ යුද ඉතිහාසය තුළ යුරෝපීය ජාතිකට විරුද්ධව සිදු කළ අති විශිෂ්ට යුද ජයග්‍රහණයකි. මෙය බ්‍රිතාන්‍යය ජාතිකයන්ට එරෙහිව ලාංකිකයන් ලබන ලද ප්‍රබල සහ එකම යුද ජයග්‍රහණයයි. ඇඩම් ඩේවි 1803 මහනුවර රාජ්‍යයට එරෙහිව ප්‍රකාශ කළ යුද්ධයෙහි බ්‍රිතාන්‍යය පාර්ශ්වයේ මහනුවර සේනාංකයන්හි අණදෙන නිලධාරියා යි. ලාංකික හමුදාවේ සුවිශේෂී හැකියාව වූයේ, සැඟවී සිටීම, එකවර කඩා පැන බෙල්ල සිද දැමීම, සැපයුම් කඩාකප්පල් කිරීම, වටකර පහර දීම, නිහඬ ප්‍රහාර එල්ල කිරීම, බ්‍රිතාන්‍ය සේනාංකයන්හි ආසිය සෙබළු සහ යුරෝපා සෙබළු ලෙස ද, සාමන්‍ය සෙබළු සහ නිලධාරීන් ලෙස ද යන වර්ගීකරණයෙන් හුදකලා කර පහර දීම සහ ඝාතනය, නිරාහාරව තබා ජීවිතක්ෂයට පත් කරලීම, කඩුවෙන් ශරීරය කොටස්වලට කපා ඝාතනය කිරීම, මඩවලවල්හි දමා මිය යාමට ඉඩ හැරීම, පොලු මුගුරු භාවිතයෙන් හිස කොටසට පමණක් මොලය එළියට එන තෙක් පහරදී ඝාතනය කිරීම යන ඝාතක ක්‍රම බ්‍රිතාන්‍ය සතුරු බලය විනාශ කිරීම පිණිස මහනුවර හමුදාව යොදා ගත්හ. බොහෝවිට මෙම උපක්‍රම භූමිය සහ භෞතික ලක්ෂණ තම වාසියට යොදා ගැනීමකි. මෙම ක්‍රම ඉන්දියානු උපමහද්වීප කලාපය තුළ වෙනත් සටන් භූමි තුළ ද අඩු වැඩි වශයෙන් දක්නට ලද ඒවා ය. 1803 යුද්ධය සඳහා බ්‍රිතාන්‍ය පාර්ශ්වයේ රෙජිමේන්තු 7ක් සහ පුරෝගාමී ලස්කිරිඤ්ඤ හමුදාවක් මහනුවරට ඇතුළු විය. බෙංගාල හා මදුරාසි කාලතුවක්කු රෙජිමේන්තුව, බෙංගාල හා මදුරාසි ලස්කිරිඤ්ඤ තුවක්කු හමුදාව, 19 වැනි රාජකීය හමුදා රෙජිමේන්තුව, 51 වැනි රාජකීය හමුදා රෙජිමේන්තුව, 65 වැනි රාජකීය හමුදා රෙජිමේන්තුව, මැලේ රෙජිමේන්තුව හා සිපෝයි රෙජිමේන්තුව යනු එම රෙජිමේන්තු ය. මහනුවර ඇතුළු වූ සාජන්වරු හා සාමාන්‍ය සෙබළුන්ගේ සංඛ්‍යාව 3387 කි. 1803 ජනවාරි 1 වැනි දින සිට ජූනි 30 වන දින දක්වා කාලය තුළ බ්‍රිතාන්‍ය පාර්ශ්වයේ මිය ගිය සෙබළ සංඛ්‍යාව 1091කි. මේජර් ඩේවිගේ යටත් වීමෙන් පසු බෙංගාල කාලතුවක්කු රෙජිමේන්තුව, රාජකීය 19 වැනි රෙජිමේන්තුව හා මැලේ රෙජිමේන්තුවේ පමණක් මිය ගිය සංඛ්‍යාව 613කි. ඇඩම් ඩේවි 1812 දී මහනුවර සිර අඩස්සියේ සිටියදී මරණයට පත් විය. 1803 ඇඩම් ඩේවිගේ නායකත්වයෙන් බ්‍රිතාන්‍යයන් ඇති කළ යුද්ධය මහනුවර ආක්‍රමණය පිණිස ගිය බ්‍රිතාන්‍ය සෙබළුන්ගේ "සමූල ඝාතනයකින්" නිමා වූ බවට නිගමනය කළ හැකි ප්‍රමාණවත් සාක්ෂි තිබේ.

**ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය**


අභයවර්ධන, එච්.ඒ.පී. (2004). *කඳුරට ප්‍රවේණිය*. කඳුරට සංවර්ධන බැංකුවේ ප්‍රකාශන.

*ඉංග්‍රීසි හටන*, (2001). (සුගතදාස මල්ලගොඩ, සංස්.). එස්. ගොඩගේ සහ සමාගම.

*දුනුවිල හටන*, (1957). (ශ්‍රී චාල්ස් ද සිල්වා, ප්‍රතිපාදිත.). ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

පර්සිවල්, ආර්. (2013). *රොබට් පර්සිවල් දුටු ලංකාව*. යසපාල වනසිංහ (පරි.). සූරිය ප්‍රකාශකයෝ.

*මහාවංසය*, 1963. (එච්. සුමංගල හිමි සහ බටුවන්තුඩාව පණ්ඩිත, සංස්.). කොළඹ: රත්නකාර බුක් ඩිපෝට්.

ලෙමෙසූරියර්, සී.ජේ.ආර්., සහ පානබොක්ක, ටී.බී. (2009). *නීති නිඝණ්ඩුව නොහොත් නීතියේ අර්ථ නිරූපනය.* (අභය හේවාවසම්, පරි.). සූරිය ප්‍රකාශන.

හෙට්ටිආරච්චි, ඇස්. බී. (2008). *ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය*. කතෘ ප්‍රකාශන.

David, H. (1995). *The British Conquest of Ceylon and the Massacre at Kandy 1803*. The Napoleon Series. https://www.napoleon-series.org/military-information/battles-and-campaigns/the-british-conquest-of-ceylon-and-the-massacre-at-kandy-1803/#_ftnref13.

Davy, J. (1821). *An account of the interior of ceylon, and of its inhabitants*. A.& R.Spotswood.

*Diary of John D'oyly,* (1917). (H. W. Codrington, Ed.). Navrang.

Goodman, R. (2013). The power to kill or capture enemy combatants. *The European Journal of International Law*, *24*(3). Oxford University Press.

Johnston, A. (1854). *Narrative of the Operations of a Detachment in an Expedition to Candy, in the Island of Ceylon, in the Year 1804*. Dublin, James M'Glashan.

*Letters on Ceylon*, L. de Bussche. (1817). J. J. Stockdale.

Lewis, J. P. (1923). The Captivity of Major Davie. *The Journal of the Ceylon Branch of the Royal Asiatic Society of Great Britain & Ireland*, *29*(76), 147–185. http://www.jstor.org/stable/43483217

Marshall, H. (1846). *Ceylon, a general description of the island and its inhabitants; with an historical sketch of the conquest of the colony by the English*. William h. Allen and Co.

Peiris, P. E. (1939). *Tri sinhala the last phase 1796-1815*. Navrang.

Percival, R. (1803). *An account of the island of ceylon*. The Colombo Apothecaries co., Ltd.

Philalethes, A. M., & Knox, R. (1817). *The History of Ceylon, from the Earliest Period to the Year MDCCCXV: To Which is Subjoined, Robert Knox's Historical Relation of the Island*. Joseph Mawman.

Powell, G. (1973). *The Kandyan Wars*. Navarang.

Vimalananda, T. (1970). *The grate rebellion of 1818*. MD Gunasena & Company.

Yule, H., & Burnell, A. C. (1903). *Hobson-Jobson : the Anglo-Indian dictionary*. John Murray.